54 වන කාණ්ඩය
12 වන කලාපය

බදාද
1963 ඔක්තෝබර් 16

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1683]

පෞද්ගලික මන්ත්‍රීගෙ යෝජනාව [තී. 1714] :
ලංකාවේ සිටින ඉන්දියානුන් ආපසු ඉන්දියාවට යැවීම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 54
இல. 12

புதன்கிழமை,
16 ஒக்டோபர், 1963

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகாரபூர்வமான அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1683]

தனியங்கத்தவர் பிரேரணை [ப. 1714] :
இலங்கையிலுள்ள இந்தியர்களைத் தாய்நாட்டுக்குத் திருப்பியனுப்பல்

---

Volume 54
No. 12

Wednesday,
16th October, 1963

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

**ORAL ANSWERS TO QUESTIONS** [c. 1683]

**PRIVATE MEMBER'S MOTION** [c. 1714] :
**Repatriation of Indians in Ceylon**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## 1963 ඔක්තෝබර් 16 වන බදාදා

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු ආර්. එස්. පැල්පොල] මූලාසනාරූඪ විය.

---

## සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලත් සංදේශ

### மூதவையிலிருந்து வந்த செய்திகள்

### MESSAGES FROM THE SENATE

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලත් සන්දේශ ලේකම් දැන් කියවයි.

පහත දැක්වෙන සංදේශ ලේකම් විසින් කියවන ලදි:

I

"1946 සහ 1947 ලංකා (ආණ්ඩුක්‍රම සහ ස්වාධීනතා) රාජාඥාවන් සහ අනිකුත් ලිඛිත නීති පිළිබඳව, කාරක සභාව අවශ්‍යයයි අදහස් කරන අනිකුත් කරුණු අතර—

(1) සමූහාණ්ඩුවක් පිහිටුවීම,

(2) මූලික අයිතිවාසිකම් සහතික කිරීම,

(3) සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලීය පත් කළ මන්ත්‍රීන් පිළිබඳ තත්ත්වය,

(4) රජයේ සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම,

යන කරුණුද සම්බන්ධයෙන් සංශෝධනය කිරීම සලකා බැලීම පිණිස සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ඒකාබද්ධ විශේෂ කාරක සභාවක් පත් කිරීම යෝග්‍යය." යන සම්මතියට සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සමග එකඟත්වයට පැමිණ සිටියි.

II

අංකය: ඕ. 1/52—53 (11)
1963 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ දීය.

මහත්මයාණනි,

1946 සහ 1947 ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රා[illegible] (2) [illegible]රණ ඡේදය අනුව, පහ[illegible] [illegible]යන් තෝරන ලද සෙනෙට් මන්ත්‍රීන් පස් දෙනාගේ සේවා කාලය නිමවූයෙන් ඔවුන් දැරූ අසුන් අද දින පුරප්පාඩු වූ බව මෙයින් දැනුම් දෙනු කැමැත්තෙමි.

අභයසේකර වත්තකු ආරච්චිගේ දොන් සමර දිවාකර ජයසේකර සෙනෙට් මන්ත්‍රීතුමා.

ඇන්තනි තියොඩොරික් ආර්මන්ඩ් ද සූසා සෙනෙට් මන්ත්‍රීතුමා.

මනමෙල්දූර පියසන් ද සොයිසා සෙනෙට් මන්ත්‍රීතුමා.

ඥානප්‍රගාසම් නල්ලයියා සෙනෙට් මන්ත්‍රීතුමා.

චාර්ල්ස් බාර්ටන් සෙනෙට් මන්ත්‍රීතුමා, සාමදාන විනිශ්චයකාර, නිල නොලත් මහේස්ත්‍රාත්.

මේ වගට,
ඔබගේ කීකරු සේවක,
අ. කළේ: බී. කොස්වත්ත,
සෙනෙට් සභා කාර්ය සම්පාදක.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්,
කොළඹ.

## නිවේදනය

### அறிவிப்பு

### ANNOUNCEMENT

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්ගේ ලිපිය සම්බන්ධයෙන් කිව යුත්තේ, මෙම මන්ත්‍රී මණ්ඩලය සෙනෙට් මන්ත්‍රීන් පස් දෙනෙකු තෝරා පත් කිරීමෙහි නිරත වීම අවශ්‍ය බවය.

ඒ සඳහා නාමයෝජනා පත්‍ර මෙම මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්ගෙන් ලබාගත හැකිය. නාමයෝජනා පත්‍රයන් මන්ත්‍රීන් දෙදෙනෙකු විසින් යෝජක සහ සථිරකරු වශයෙන් අත්සන් කර තිබිය යුතු බවත්, යෝජිත අපේක්ෂකයාගේ කැමැත්ත නාමයෝජනා පත්‍රය මත ලියා තිබිය යුතු බවත්, මන්ත්‍රීන් විසින් සිත්හි තබාගත යුතුය. නාමයෝජනා පත්‍ර සියල්ලක්ම 1963 ඔක්තෝබර් මස 17 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 4ට ප්‍රථම ලේකම්ට භාර දිය යුතුය. එවිට ඔහු විසින් තමා භාරගත් සෑම නාමයෝජනා පත්‍රයක් සම්බන්ධයෙන්ම එය තමා භාරගත් බවට ලියවිල්ලක් දිය යුතුය. ඡන්ද විමසීමක් අවශ්‍ය බව නාමයෝජනා



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කථානායකතුමා]

වෙන් පෙනේ නම් ඡන්ද විමසීම 1963 ඔක්තෝබර් මස 18 වැනි සිකුරාදා පූ. භා. 10ට පැවැත්වෙනු ඇත.

With regard to the letter from the Clerk of the Senate, it is necessary for this House to proceed to the election of five Senators.

Nomination papers may be obtained from the Clerk of the House. Members will bear in mind that a nomination paper has to be signed by two Members as proposer and seconder and must bear on its face the written consent of the candidate proposed. All nomination papers must be handed in to the Clerk before 4 p.m. on Thursday, the 17th October, 1963, and he will hand in exchange a written acknowledgment. If the nominations indicate that an election is necessary, the elections will be held on Friday, the 18th October, 1963, at 10 a.m.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
### PAPERS PRESENTED

1963 අංක 4 දරණ දේශීය ආදායම් පණතේ 11(2)(ii) හා 125(2)(ඊ); II (3) හා 125 යන වගන්ති යටතේ සම්පාදනය කරන ලද ව්‍යවස්ථා දෙකක්.—[ගරු ඉලංගරත්න.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
### வினாக்களுக்கு வாய்மூல விடைகள்
### ORAL ANSWERS TO QUESTIONS

### ශ්‍රී ලංකා මහා බැංකුව : තාවකාලික ලිපිකරුවන් පත් කිරීම
### இலங்கை மத்திய வங்கி : தற்காலிக எழுதுவினைஞர் நியமனம்
### CENTRAL BANK OF CEYLON : APPOINTMENT OF TEMPORARY CLERKS

2. **ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலப்பிட்டிய)*

(Mr. Lakshman Jayakody—Divulapitiya)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පසුගිය හය මාසය තුළදී තාවකාලික ලිපිකරුවන් පත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහා බැංකුව දැන්වීම් පළ කළ බව එතුමා දන්නවාද? (ආ) පිරිවෙන් විශ්ව විද්‍යාලවල උපාධි දරන්නවුන් කී දෙනෙකුගෙන් ඉල්ලුම් පත්‍ර ලැබුණේද? කී දෙනෙකු තෝරාගන්නා ලද්දේද? (ඉ) ශ්‍රී ලංකා මහා බැංකුව එවැනි ඉල්ලුම් පත්‍ර ඉවත් කෙළේද? එසේ නම්, ඒ මන්ද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கை மத்திய வங்கி கடந்த ஆறு மாத காலத்தில் தற்காலிக எழுதுவினைஞர்களை நியமிப்பதற்கு விளம்பரஞ் செய்ததென்பதை அவர் அறிவாரா? (ஆ) இரு பிரிவேனப் பல்கலைக் கழகங்களைச் சேர்ந்த பட்டதாரிகளிடமிருந்து எத்தனை விண்ணப்பங்கள் பெறப்பட்டன? எத்தனை பேர் தெரிவு செய்யப் பட்டனர்? (இ) அத்தகைய விண்ணப் பங்களை மத்திய வங்கி நிராகரித்ததா? ஆமெனில் ஏன்?*

asked the Minister of Finance: (*a*) Is he aware that the Central Bank of Ceylon advertised for the appointment of temporary clerks during the last six months? (*b*) How many applications were received from degree holders of the two Pirivena Universities and how many were selected? (*c*) Did the Central Bank exclude such applications; if so why?

**ගරු ටී. බී. ඉලංගරත්න** (මුදල් ඇමති)

***(கௌரவ ரி. பி. இலங்கரத்ன—நிதியமைச்சர்)***

(The Hon. T. B. Ilangaratne—Minister of Finance)

(අ) නැත. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවාවට තාවකාලික ලිපිකරුවන් පත් කිරීම සඳහා අවසාන දැන්වීම පළ වූයේ 1962 සැප්තැම්බර් 28 වන දය. (ආ) 1962 සැප්තැම්බර් 28 වන ද දැන්වීමට පිළිතුරු වශයෙන් පිරිවෙන් විශ්ව විද්‍යාල දෙකේ උපාධිධාරීන්ගෙන් ඉල්ලුම් පත්‍ර ලැබුණේ නැත. (ඉ) (ආ) හි සඳහන් කරුණ නිසා මෙය පැන නොනගී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ග්‍රාම සේවකයින්ට ගෙවන කාර්යාල දීමනා

கிராமசேவையாளருக்கு அலுவலகப் படி

OFFICE ALLOWANCE TO GRAMA SEVAKAS

3. ගාමිණී ජයසූරිය මයා. (හෝමාගම)
(திரு. காமினி ஜயசூரிய—ஹோமகம)
(Mr. Gamani Jayasuriya—Homagama)

පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගම්මුලාදෑනීන් වෙනුවට පත් කරන ලද ග්‍රාම සේවකයින්ට මසකට රුපියල් 4.80 ක කාර්යාල දීමනාවක් ගෙවන බව එතුමා දන්නවාද? (ආ) තමන්ගේ නිවාසවල සිට රාජකාරියේ යෙදුණු ගම්මුලාදෑනීන්ට මසකට රුපියල් 10 ක් ගෙවූ බැවින් ඔවුන්ට රුපියල් 4.80 ක කාර්යාල දීමනාවක් දීම අයුක්තියක් බව එතුමා දන්නවාද? (ඉ) එසේ නම්, ග්‍රාම සේවකයින්ට සෑහෙන කාර්යාල දීමනාවක් දීමට එතුමා වහාම ක්‍රියා කරනවාද?

உள்ளூராட்சி, உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) கிராமத்தலைமைக்காரர்களுக்குப் பதிலாக நியமிக்கப்பட்ட கிராமசேவையாளர்களுக்கு அலுவலகப் படியாக ரூபா 4.80 வழங்கப்படுகின்றதென்பதை அவர் அறிவாரா? (ஆ) தங்களது வீடுகளிலிருந்து கடமையாற்றிக்கொண்டிருந்த கிராமத்தலைமைக்காரர்களுக்கு 10 ரூபா அலுவலகப் படியாக வழங்கப்பட்டிருக்கையில், கிராமசேவையாளர்களுக்கு ரூபா 4.80 அலுவலகப் படியாக வழங்குவது அநீதியானதென்பதை அவர் அறிவாரா? (இ) அவ்வாறாயின், கிராமசேவையாளர்களுக்கு நியாயமானவொரு அலுவலகப் படியை வழங்குவதற்கு அவர் உடனடியாக நடவடிக்கையெடுப்பாரா?

asked the Parliamentary Secretary to the Minister of Local Government and Home Affairs: (*a*) Is he aware that the Grama Sevakas who have been appointed in place of Village Headmen are paid an office allowance of Rs. 4.80 per month? (*b*) Is he aware that it is an injustice to pay them Rs. 4.80 as office allowance since the Village Headmen who worked from their homes were paid an office allowance of Rs. 10 per month? (c) If so, will he take immediate action to pay a reasonable office allowance to the Grama Sevakas?

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා. (පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. டப்ளியு. பீ. ஜீ. ஆரியதாச—உள்ளூராட்சி, உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. W. P. G. Ariyadasa—Parliamentary Secretary to the Minister of Local Government and Home Affairs)

(අ) නැත. ඔවුන්ට ගෙවනු ලබන්නේ කාර්යාල දීමනාවක් නොව ගෙවල් කුලී දීමනාවය; (ආ) ගම්මුලාදෑනීන්ට කාර්යාල දීමනාව වශයෙන් රු. 10 ක් ගෙවන ලද්දේ ඔවුන්ට ගෙවල් කුලී දීමනාව නොගෙවූ බැවින් හා ග්‍රාම සේවකයින්ට වඩා අඩු වැටුපක් ඔවුන්ට ලැබුණු බැවින්ය. ගෙවල් කුලී දීමනා ලැබීමට ග්‍රාමසේවකයින් සුදුස්සන් වන අතර ඔවුන්ගේ කාර්යාලයයන් ඔවුන් නැවතී සිටින ස්ථානවලම පිහිටුවා ඇති හෙයින්ද ගම්මුලාදෑනීන්ට මෙන් නොව ග්‍රාම සේවකයින් වැඩි වැටුපක් ලබන බැවින්ද කාර්යාල දීමනාවක් ඔවුන්ට අවශ්‍යයයි කල්පනා කරනු නොලැබේ; (ඉ) ඉහතින් දක්වන ලද කරුණු අනුව මේ ගැන තව දුරටත් ක්‍රියා කිරීමට බලාපොරොත්තුවක් නොමැත.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු ලේකම්තුමා දන්නවා ඇති, කාර්යාල දීමනාවක් වශයෙන් කීවත්, ගෙවල් කුලී දීමනාවක් වශයෙන් කීවත්, කාර්යාල කටයුතු කරන්නේත් පදිංචිව සිටින්නේත් එකම ස්ථානයේ නිසා, මේ දීමනාව එකම කාරණයක් සඳහා බව. තවත් පැහැදිලි කරනවා නම්, දැනට ග්‍රාම සේවකයන් පදිංචි ස්ථානය කාර්යාලය වශයෙන් පාවිච්චි කරන බව කියන්න පුළුවනි. එම නිසා කාර්යාල දීමනාව වශයෙන්ය කියාත් ගෙවල් කුලිය වශයෙන්ය කියාත් වෙන් කිරීම හරි නැහැ. මෙම ග්‍රාම සේවකයන්ට ඉස්සර සිටි ගම්මුලාදෑනීන්ට මෙන් තමන්ගෙ ගමේම, තමන්ගෙ ගෙදරම පදිංචිව සිටින්න බැහැ. ඉස්සර ගම්මුලාදෑනීන්ට පරම්පරාවෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

තමන්ගේ ගමේම ගෙයක් තිබුණා. නමුත් මේ උදවියට නියමයක් වශයෙන්ම ගමේ සේවය කරන්න බැහැ. එසේ නම් තමන් සේවය සඳහා පත් කරන පළාතෙන් කාර්යාලයක් සඳහා ගෙයක් ලබා ගත යුතු මයි. ඒ අයට පදිංචිය සඳහා සුදුසු ස්ථාන යක් නොලැබුණොත් රාජකාරි කටයුතු කරන්න බැහැ. එහෙත් ඒ උදවියට මේ අන්දමට සැලකීමෙන් කොතරම් අසාධා රණ තත්ත්වයක් ඇති වෙනවාද? සේව යක් කිරීම සඳහා ඉදිරිපත් වී සිටින ඒ හොඳ තරුණයන් මේ විධියේ වැඩ පිළි වෙළවල් නිසා නරක් වෙන්න ඉඩ තිබෙ නවා. එම නිසා ඒ විධියේ ක්‍රමයක් මෙතෙක් අනුගමනය කරගෙන ආවත් මින් ඉදිරියටවත් මේ ගැන සලකා බලා ඒ අයට හොඳින් වැඩ කටයුතු කරගෙන යන්නට පුළුවන් මුදලක් ගෙවන ලෙස මේ අවස්ථාවේදී ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

**ආරියදාස මයා.**

*(திரு. ஆரியதாச)*

(Mr. Ariyadasa)

ඉදිරිපත් කරන ලද කාරණා සම්බන්ධ යෙන් සලකා බලනව.

**ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන් තොට)

*(டொக்டர் என். எம். பெரேரா—யட்டியாந் தோட்டை)*

(Dr. N. M. Perera—Yatiyantota)

මේ ප්‍රශ්නය ගැන තවදුරටත් ඉල්ලීමක් කරන්න මම කල්පනා කරනවා. පරණ ගම්මුලාදෑනීන්ට නොයෙකුත් අන්දමින් උපකාර කරන පුද්ගලයන්, ආධාර කාර යන්, ගමේම හිටියා. ඒක ස්වභාවික දෙයක්. නොයෙක් අන්දමේ අල්ලස්, දූෂණ මාර්ගයෙන් තමන්ගේ තත්ත්වය ආරක්ෂා කර ගන්න පුළුවන් කමක් තිබුණා. නමුත් ඒ තත්ත්වය දැන් සම් පූර්ණයෙන්ම වෙනස්. ග්‍රාම සේවකයන් වශයෙන් පළාත්වලට පත්වන උදවිය අලුත් පුද්ගලයන් නිසා, ඒ අයගෙන් ප්‍රයෝජනවත් වැඩ කොටසක් ඉටු කරවා ගැනීමට නම් මෙයට වඩා පහසුකම් සල සන්න ඕනෑ. ගෙවල් කුලී දීමනා පමණක් නොවෙයි, ලිපිකාරයනුත් සපයා දෙන්න ඕනෑ. එතකොට තමයි ඒ අයගෙන් නියම ප්‍රයෝජනයක් මහජනතාවට ලබාගන්න පුළුවන් වෙන්නෙ. ඉතා උනන්දුවෙන් වැඩ කරන හොඳ තරුණයන් මේ සේවා වට පත් වී සිටිනවා. එම නිසා මේ කාරණා ගැන නැවත වරක් කල්පනා කරන බලන ලෙස මතක් කර සිටිනවා.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ** (අකුරැස්ස)

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)*

(Dr. S. A. Wickremasinghe—Akuressa)

ගම්මුලාදෑනීන් වෙනුවට ග්‍රාම සේවක යන් පත් කර තිබෙනවා. ඉස්සර ගම්මුලා දෑනීන් තමන්ගෙම ගමේ තමන්ගෙම ගෙදරයි පදිංචිව සිටියෙ. එම නිසා ගෙවල් කුලී ගෙවීම් සහ වෙනත් අමතර විය හිය දම් කරන්න උවමනාකමක් තිබුණෙ නැහැ. තමන්ගෙ තත්ත්වය ආරක්ෂා කරගෙන කටයුතු කරන්න පුළුවන් කමක් තිබුණා. නමුත් දැන් තත්ත්වය එහෙම නොවෙයි. ග්‍රාම සේවකයන් වශයෙන් පත් කරන උදවියට තමන්ගෙ පළාතෙන් බොහෝ ඈත පළාත්වලට පත් වීම් දී තිබෙනවා. මේ නිසා ඔවුන්ට ගෙවල් කුලී ආදිය ගෙවී මට, වෙනත් අමතර වියදම් දැරීමට සිදු වී තිබෙනවා.

එපමණක් නොවෙයි, ඉස්සර ගම්මුලා දෑනියකු වෙනත් ගම්මුලාදෑනියකුගේ වැඩ බැලීම් කරන විට ඒ වෙනුවට අතිරේක මුදලක් ගෙවනවා. නමුත් දැන් ග්‍රාම සේවකයකු වෙනත් ග්‍රාම සේවකයකුගේ වැඩ බැලුවොත් එසේ ගෙවන්නෙ නැහැ. ඒ හැරෙන්නට ඒ කාලයේ ගම් මුලාදෑනීන්ට අමතර රාජකාරි කටයුතු සඳහා වෙනත් ගෙවීම් කරනු ලැබුවා. නමුත් එබඳු ගෙවීම් මේ අයට කරන්නෙ නැහැ. මේ හැරෙන්නට මේ අයට අප්‍රමාණ දුෂ්කර තාවයන්ට මුහුණ පාන්න සිදු වී තිබෙනව. ජීවන වියදම ඉහළ නැග තිබෙන නිසා එදා ගෙවපු මුදලට වඩා වැඩි මුදලක් ගෙවන්න ඕනෑ. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මේ කාරණා ගැන හොඳින් කල්පනා කර බලා ඒ අයට සහනයක් සලසා දෙනවා ඇත කියා මම කල්පනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා. (කොට්ටාව)
(திரு. டி. பி. ஆர். குணவர்தன—கொட்டாவ)
(Mr. D. B. R. Gunawardena—Kottawa)
මටත් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. [බාධා කිරීමක්].

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
දැනටමත් ප්‍රශ්න තුනක් අසා තිබෙනවා.

### ශ්‍රී ලංකා ලලිත කලායතනය සඳහා වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය

நுண்கலைக் கல்லூரி : ஒதுக்கப்பட்ட பணம்

COLLEGE OF FINE ARTS : MONIES VOTED

7. ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)
(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)
(Mr. Leslie Goonewardene—Panadura)
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: 1962-63 හා 1963-64 යන වර්ෂ සඳහා කොපමණ මුදලක් ශ්‍රී ලංකා ලලිත කලායතනය සඳහා වෙන් කර තිබේද ?

கல்வி, கலாச்சார விவகார அமைச்சரைக் கேட்ட வினா: 1962–63, 1963–64 ஆகிய நிதி வருடங்களில் நுண்கலைக் கல்லூரிக்கென ஒதுக்கப்பட்டுள்ள பணமெவ்வளவு?

asked the Minister of Education and Cultural Affairs: How much money has been voted for the College of Fine Arts for the Financial Years 1962-63 and 1963-64 ?

ටී. බී. තෙන්නකෝන් මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. ரி. பி. தென்னகோன்—கல்வி, கலாச்சார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. T. B. Tennekoon—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

| | | 1962/63 | 1963/64 |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | - | 461,521 | 519,156 |
| මූලධන ” | - | 185,000 | 100,000 |
| එකතුව | | 646,521 | 619,156 |

### ශ්‍රී ලංකා ලලිත කලායතනය: කුලරත්න කොමිෂමේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම

நுண்கலைக் கல்லூரி: குலரத்ன ஆணைக்குழுவின் சிபாரிசுகளைச் செயற்படுத்தல்

COLLEGE OF FINE ARTS: IMPLEMENTATION OF THE RECOMMENDATIONS OF THE KULARATNE COMMISSION

8. ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ශ්‍රී ලංකා ලලිත කලායතනය සම්බන්ධයෙන් කුලරත්න කොමිෂමේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට එතුමා අදහස් කරන වාද? (ආ) එසේ නම්, ඒ කවදාද ?

கல்வி, கலாச்சார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) நுண்கலைக் கல்லூரி சம்பந்தமான குலரத்ன ஆணைக்குழுவின் சிபார்சுகளைச் செயற்படுத்துவதற்கு அவர் உத்தேசிக்கின்றாரா? (ஆ) அவ்வாறாயின், எப்பொழுது? எவ்வாறு செயற்படுத்த விரும்புகிறார்?

asked the Minister of Education and Cultural Affairs: (a) Does he propose to implement the recommendations of the Kularatne Commission regarding the College of Fine Arts? (b) If so, when and how ?

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரி. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)
(අ) කුලරත්න විශේෂ කාරක සභා වාර්තාවේ නිර්දේශයන් බොහොමයක්ම දැනට ක්‍රියාත්මක කර ඇත. 1958 නිකුත් කොට ඇති මෙම වාර්තාවේ සෑම නිර්දේශයක්ම දැන් තත්ත්වය අනුව ක්‍රියාත්මක කළ යුතු අන්දම ගැන වාර්තාවක් සපයන ලෙස ශ්‍රී ලංකා ජාතික කලායතන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂගෙන් හා රෙජිස්ට්‍රාර් තැනගෙන් ඉල්ලා ඇත. දැනට ක්‍රියාත්මක නොකොට ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව ඉහත සඳහන් වාර්තාව ලැබුණ පසු සලකා බලමි. (ආ) ඉහත (අ) අනුව පිළිතුරු අවශ්‍ය නොවේ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

ඒ වාර්තාව ඉල්ලා තිබෙන්නේ කවදද ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரி. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

පසු ගිය මාසයේ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

මම මේ ප්‍රශ්නය ඇසුවාට පසුයි, ඒ වාර්තාව ඉල්ලා තිබෙන්නෙ. ඒ වාර්තාව ලැබේයයි කල්පනා කරන්නේ කවදද ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரி. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

පුළුවන් ඉක්මනින් එය ලබාගැනීම සඳහා කටයුතු කිරීමට වග බලාගන්නවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(டொக்டர் என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

කුලරත්න කාරක සභා වාර්තාව පිට වුණේ කවදද ? දැන් අවුරුදු දෙකක් වෙනවා. මෙතෙක් කල් මොකද කළේ ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரி. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

ඒ වාර්තාව කැබිනට් මණ්ඩලය පිළිගෙන තිබෙන්නේ 60. 12. 21 දින. ඒ වාර්තාවේ සඳහන් කරුණු හුඟක් දුරට ක්‍රියාත්මක කර තිබෙනවා.

**එම්. එස්. එම්. රේයල් මහතා, මග්ගොන, ඉදිරිලිගොඩ**

*திரு. எம். எஸ். எம். றியால், இந்திரிலிகொட, மக்கொன*

MR. M. S. M. REYAL, INDIRILIGODA, MAGGONA

9. **සිරිල් මැතිව් මයා.** (කොළොන්න)

*(திரு. சிறில் மதியூ—கொலன்ன)*

(Mr. Cyril Mathew—Kolonna)

රාජ්‍යාරක්‍ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) මග්ගොන, ඉදිරිලිගොඩ "රූම් විලා" හි එම්. එස්. එම්. රේයල් මහතා මාණික්‍ය විද්‍යාව පිළිබඳ පාඨමාලාවක් හැදෑරීම සඳහා බ්‍රිතාන්‍යයට යාම පිණිස විදේශ ගමන් අවසර පත්‍රයක් ඉල්ලුම් කෙළේද ? (ආ) ඉල්ලුම් පත්‍රය ප්‍රතික්‍ෂේප කරන ලද්දේ මන්ද ? (ඉ) මෙම විද්‍යාව සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීම සඳහා පහසුකම් ලංකාවේ තිබේද ?

*பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா : (அ) மக்கொனவைச் சேர்ந்த இந்திரிலி கொடவிலுள்ள "றூம் வில்லா" வில் வதியும் திரு. எம். எஸ். எம். றெயால் மாணிக்கவியலிற் பயிற்சி பெறுவதற்கெனப் பிரித்தானியாவுக்குச் செல்வதற்கு பாஸ்போர்ட் ஒன்றுக்கு விண்ணப்பித்தாரா ? (ஆ) அவ்விண்ணப்பம் மறுக்கப்பட்டதேன் ? (இ) இத்துறையிற் கற்றுத்தகைமையடைவதற்கேற்ற வசதிகள் இலங்கையில் உண்டா ?*

asked the Parliamentary Secretary to the Minister of Defence and External Affairs : (*a*) Did Mr. M. S. M. Reyal "Room Villa", Indiriligoda, Maggona, apply for a passport to proceed to Britain in order to follow a course in Gemmology ? (*b*) Why was the application refused ? (*c*) Are there facilities available in Ceylon to qualify in this field of studies ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක (කෘෂිකර්ම, ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ ඇමති හා රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—விவசாய, உணவு, கூட்டுறவு அமைச்சரும், பாதுகாப்பு, வெளி விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. F. R. Dias Bandaranaike—Minister of Agriculture, Food and Co-operatives and Parliamentary Secretary to the Minister of Defence and External Affairs)

(*a*) Yes. (*b*) Not refused. Mr. Reyal has not satisfied the Department of Immigration and Emigration that he has made arrangements to enter an institution in the U. K., nor has he obtained clearance from the Commissioner of Inland Revenue and the Controller of Exchange, although he was advised to do so. (*c*) This question may more appropriately be addressed to the Hon. Minister of Education.

**ගාල්ලේ, බෝපේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සංචාරක පණිවුඩකරු කේ. එල්. ජී. කළුඅප්පුහාමි මහතා**

*திரு. கே. எல். ஜீ. களுஅப்புகாமி, நில அளவைப் பகுதிச் சுற்றுப்பிரயாணத் தூதுவர், போப்பே, காலி*

MR. K. L. G. KALUAPPUHAMY, CIRCUIT MESSENGER OF THE SURVEY DEPARTMENT, BOPE, GALLE

10. **ඩබ්ලිව්. දහනායක මයා.** (ගාල්ල)

*(திரு. டப்ளியு. தகநாயக்க—காலி)*

(Mr. W. Dahanayake—Galle)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගාල්ලේ, බෝපේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සංචාරක පණිවුඩකරුවෙකු වන කේ. එල්. ජී. කළුඅප්පුහාමි මහතාට පහත සඳහන් පහසුකම් නොදෙන්නේ මන්ද? (i) ගෙවල් කුලී පහසුකම්, (ii) ගෙවල් කුලී පහසුකම් නැති නිසා බටා, (iii) ගමන් බටා, (iv) වැඩ නවත්වා ඇති කාලය තුළ අඩු වශයෙන් අර්ධ වැටුප්, (v) වාර්ෂික වැටුප් වැඩිවීම්. (ආ) මේ සියළුම දුක් ගැනවිලි සම්බන්ධයෙන් එතුමා පරීක්ෂණයක් පවත්වනවාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) காலி, போப்பேயிலுள்ள நில அளவைத் திணைக்களத்தைச் சேர்ந்த சுற்றுப்பயணத் தூதுவரான திரு. கே. எல். ஜீ. களுஅப்புகாமிக்கு, (i) வாடகை வசதிகள், (ii) வாடகை வசதிகள் அளிக்கப்படாமைக்குரிய படி, (iii) போக்குவரத்துப் படி, (iv) வேலையினின்றும் தற்காலிகமாய் நிறுத்தப்பட்டுள்ள காலத்திற்குக் குறைந்தது அரைச் சம்பளமாவது வழங்குதல், (v) வருடாந்தச் சம்பள உயர்ச்சிகள் ஆகியன வழங்கப்படாததேன்? (ஆ) அவரது குறைகளனைத்தையுமிட்டு அவர் விசாரணையொன்று நடாத்துவாரா?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Why has Mr. K. L. G. Kaluappuhamy, Circuit Messenger of the Survey Department, Bope, Galle, not been given the following facilities: (i) rent facilities; (ii) batta for not having rent facilities; (iii) transport batta; (iv) at least half pay during the period of interdiction? (v) annual increments? (*b*) Will he hold an inquiry into all his grievances?

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(අ) (i) කේ. එල්. ජී. කළුඅප්පුහාමි මහතාට ගෙවල් කුලී දීමනා ගෙවා තිබේ. (ii) (අ) (i) හේතුකොට මෙය පැන නොනගී. (iii) ඔහුගේ සහකාර මිනින්දෝරු අධිකාරී සමඟ ගිය ගමන්වලට රෙගුලාසිවලට අනුකූලව ඔහුට ගමන් බටා ගෙවා තිබේ. (iv) ඔහුගේ වැඩ තහනම් කළේ නැත. (v) වාර්ෂික පඩි වැඩිවීම් ගෙවා තිබේ. (ආ) ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද පැමිණිලි ගැන විභාගයක් මිනින්දෝරු අධිකාරි විසින් පවත්වා සුදුසු පරිදි ක්‍රියා කරනු ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

**එන්. ජී. ඒ. සෝමවතී මහත්මිය, ගා/උළුවිටකේ ජයසුමනාරාම පාසැල**
*செல்வி என். ஜீ. ஏ. சோமாவதி, ஜி/உலு விற்றகே ஜயசுமனராமய பாடசாலை*
MISS N. G. A. SOMAWATHIE, G/ULUWITIKE JAYASUMANARAMAYA SCHOOL

11. **ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : ගා/උළුවිටකේ ජයසුමනාරාම පාසැල රජයට පවරා ගත් අවස්ථාවේදී පොරොන්දු වූ පරිදි, එහි සේවය කළ එන්. ජී. ඒ. සෝමවතී මහත්මියට පත්වීමක් නොදෙන්නේ මන්ද ?

*கல்வி, கலாச்சார விவகார அமைச்சரைக் கேட்ட வினா: ஜி/உலுவிற்றகே ஜயசுமனாராமய பாடசாலையைச் சேர்ந்த செல்வி என். ஜீ. ஏ. சோமவதிக்கு அளிக்கப்பட்ட வாக்குறுதியின் பிரகாரம் அப்பாடசாலைப் பொறுப்பேற்கப்பட்டபொழுது அவருக்கு நியமனமொன்று வழங்கப்படாததேன்?*

asked the Minister of Education and Cultural Affairs: Why is Miss N. G. A. Somawathie of G/Uluwitike Jayasumanaramaya School, not given an appointment, as was promised when the school was taken over ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

(අ) ගා/උළුවිටකේ ජයසුමනාරාමය විද්‍යාලයේ, එන්. ජී. ඒ. සෝමවතී මෙනෙවියට, එම පාසල රජයට පවරා ගන්නා අවස්ථාවේදී පත්වීමක් දෙන බවට පොරොන්දුවක් දී නොමැත. තවද, වැඩිපුර සිටි ගුරුවරුන්ට පත්වීම් දෙන අවස්ථාවේදී, අදාළ නීතිරීති අනුව සෝමවතී මෙනෙවියට පත්වීමක් දීමට සුදුසුකම් නොමැති බව පෙනී ගොස් ඇත.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

මොකද සුදුසුකම් නැත කියන්නෙ ? මොන කරුනක් නිසා සුදුසුකම් නැත කියනවාද ? මේ පාසැල ආණ්ඩුවට පවරා ගන්නා අවස්ථාවේදී මේ ගුරුවරියත් ඒ පාසැලේ ගුරුවරියක් හැටියට වැඩ කර ගෙන ගියා. එම නිසා සුදුසුකම් නැත කියන්නේ මොන කරුණක් නිසාද කියා දැනගන්නට කැමතියි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු කථානායකතුමනි, උළුවිටකේ ජයසුමනාරාමය විද්‍යාලය ආධාර ලබන පාසැලක්ව තිබී 60.12.1 දින සිට අධ්‍යක්ෂතුමාගේ පාලනය යටතට ගත් පාසැල්වලින් එකක් වන අතර, 62.11.16 වැනි දින රජයට පවරා ගෙන ඇත. එය ස්වභාෂා පාසැලකි.

මෙම පාසැල අධ්‍යක්ෂ පාලිත පාසලක්ව තිබූ අවධියේදී අනුමතිය නොලබා 61.5.23 දින සිට 61.9.6 දින දක්වා එන්. ජී. ඒ සෝමවතී මෙනෙවිය එම පාසැලේ සේවය කර තිබේ. මේ අනුව, නීතිරීති අනුව, එම මෙනෙවියට පත්වීමක් දීමට ඉඩ නැති බව දෙපාර්තමේන්තුව වාර්තා කර තිබෙනවා.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ගරු කථානායකතුමනි, ඔය තත්ත්වයම තිබුණු තවත් කීප දෙනෙකුටම පත්වීම් දී තිබෙන බව ගරු පාර්ලිමේන්තු ලේකම් තුමා දන්නවා ඇති. තුන්වැනි ශ්‍රේණියේ පාසැල්වල—ශ්‍රේඩ් 3—ඒ කියන්නේ ගම්බද පාසැල්වලට, පුරවා එවන්නය කියා පෝරම කොළයක් යැව්වා. පඩි නොලබා වැඩ කරන අයගේ නම් එහි ඇතුළත් කරන්නය කියා එහි සඳහන් කර තිබුණා. නමුත් ඒ කොළයේ තුන්වැනි ශ්‍රේණියේ පාසැල්වල සේවය කළ අයට පුරවන්නට තැනක් තිබුනේ නැහැ ; නමුත් නීතියට එකඟ නොවන අන්දමට අයුතු අන්දමට, ඒවායේ වැඩ කළ මුල්ගුරුවරුන් විසින් ලියා යැව්වා අහවල් අය අපේ පාසැලේ ඉන්නවාය කියා. එහෙම අයට පත්වීම් දුන්නා. යුක්තියට සාධාරණයට වැඩ කළ අයට තැනක් නොලැබී ගියා. දෙසියයක් තුන් සියයක් පමණ අය ඒ විධියේ පත්වීම් ලබාගෙන තිබෙනවා. මේ උදවියත් නියම විධියට වැඩ කළ උදවියයි. ඒ නිසා ඒ මහත්වරුන්ටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නෝනා මහත්වරුන්ටත් පත්වීම් දීම ඉතාමත්ම සුදුසුය කියා මා කල්පනා කරනවා. ඒ නිසා ඒ ගැන නැවත වරක් කල්පනා කර බලා සුදුස්සක් කරන්න.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු කථානායකතුමනි, එහෙම අයුක්තියක් වී තිබෙනවා නම්, මමත් කනගාටු වෙනවා. මම මේ ප්‍රකාශ කළේ දෙපාර්තමේන්තුවේ වාර්තාවයි. අපේ හෝමාගම ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අන්දමින් එවැනි තත්ත්වයේ වෙනත් අයට පත්වීම් දී තිබෙනවා නම් ඒ ගුරුවරියටත් පත්වීමක් දීමට කල්පනා කරන හැටියට ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

## ලංකා නාවුක හමුදාව : නැවියන්ගේ උසස්වීම්

*இலங்கை அரச கடற்படை : கப்பற் சேவைப் பதவியுயர்ச்சி*

## ROYAL CEYLON NAVY : PROMOTIONS OF RATINGS

1. **ආචාර්ය එන්. එම්. පෙරේරා**—(මෙරිල් ප්‍රනාන්දු මයා. වෙනුවට)

*(டொக்டர் என். எம். பெரேரா—திரு. மெரில் பெர்னண்டோ சார்பாக)*

(Dr. N. M. Perera—on behalf of Mr. Meryl Fernando)

රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) 1960 මැයි මාසයේදී වෘත්තීය පරීක්ෂණයෙන් සමත් වුවද සේවයෙන් පළමුවන පන්තියේ නැවියන් වන ඩබ්ලිව්. පී. පුන්‍යසෝම, ඒ. සී. දේවරාජා සහ ආර්. එම්. ප්‍රනාන්දුට කණිෂ්ඨ වූ පළමුවන පන්තියේ නැවියෙකු වන එම්. ජී. වික්‍රමසිංහ උසස් කරණ ලද අවසථාවේදී (1962.2.12 දින) ඉහත නම් සඳහන් නාවිකයින් වෘත්තීය විභාගය සමත්ව, ලංකා නාවුක හමුද නියෝගයේ II වැනි කොටසේ 2 වැනි ඡේදයේ අංක 57 දරණ නියෝගයේ 6 වැනි සහ 7 වැනි වගන්ති අනුව උසස් වීම් සඳහා සුදුස්සන්ව සිටියදී ඔහු සැපයීම් සහායක තනතුරට උසස් කරන ලද්දේ මන්ද? (ආ) මෙම නාවිකයින් තිදෙනාට අසාධාරණයක් සිදුවී ඇත් දැයි එතුමා පරීක්ෂා කර බලා එසේ සිදුවී තිබේ නම්, ඔවුන්ට සහනයක් ලබා දීමට වහාම ක්‍රියා කරනවාද?

*பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா : (அ) 1960, மே மாதத்தில் உயர்ச்சிப் பரீட்சையில் சித்தியெய்தியவரும், டபிள்யு. பி. புண்ணியசோம, ஏ. ஸி. தேவராஜா, ஆர். எம். பெர்னண்டோ ஆகிய 1 ஆந் தரக் கப்பற் பதவியினரிலும் பார்க்கச் சேவையிற் குறைந்தவருமான இலங்கை அரச கடற்படையைச் சேர்ந்த 1 ஆந் தரக் கப்பற் பதவியாளரான எம். ஜீ. விக்கிரமசிங்கவை விநியோக உதவியாளர் பதவிக்கு உயர்த்தியதேன் ? இவருக்கு (12.2.62 இல்) பதவியுயர்ச்சி அளிக்கப்பட்டபொழுது மேற்கூறிய மூன்று கப்பற் பதவியினரும் உயர்ச்சிப் பரீட்சையிற் சித்தியடைந்து இலங்கைக் கடற்படைக் கட்டளைகளின் 57 ஆவது கட்டளையின் பகுதி II, பிரிவு 2 இன் 6 ஆம், 7 ஆம் வாசகங்களுக்கமைய பதவியுயர்ச்சி பெறுவதற்குத் தகுதி பெற்றிருந்தனரென்பதையும் அவர் அறிவாரா ? (ஆ) இம்மூன்று கப்பற் பதவியினருக்கும் அநீதியிழைக்கப்பட்டுள்ளதாவென்பது பற்றி அவர் விசாரணையிடுவாரா ? ஆமெனில், உடனடியாய் நடவடிக்கை எடுத்து அவர்களுக்கு நிவாரணமளிப்பாரா ?*

asked the Parliamentary Secretary to the Minister of Defence and External Affairs : (*a*) Why was Class I rating M. G. Wickremasinghe of the Royal Ceylon Navy who passed the professional examination in May, 1960, but was junior to Class I ratings W. P. Punnyasoma, A. C. Devarajah and R. M. Fernando in service promoted to the post of Supply Assistant when at the time he was promoted (i.e., 12.2.62) the three sailors referred to had passed the professional examination and had qualified for advancement in terms of Clauses 6 and 7 of the Ceylon Navy Orders Part II—Section 2, Order No. 57 ? (*b*) Will he inquire whether an injustice has been done to these three sailors and if so, take immediate action to grant them redress ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
*(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(The Hon. F. R. Dias Bandaranaike)

(*a*) Stores Assistant Class I. M. G. Wickremasinghe passed the professional examination in May 1960 while Stores Assistants W. P. Punniyasoma, A. C. Devarajah and R. M. Fernando passed the professional examination in November, 1960. Wickremasinghe was promoted Leading Stores Assistant with effect from 1.1.62 as he had passed the professional examination, had the requirerd service as a Class I rating, had the stipulated period of good conduct and was recommended by his Commanding Officer for promotion. Stores Assistants W. P. Punniyasoma, A. C. Devarajah and R. M. Fernando were not recommended by their Commanding Officers for promotion to Leading Stores Assistant and were therefore not eligible for promotion. The promotion of all sailors is regulated by advancement rosters and the earlier a sailor passed his professional examination the sooner he gets on the advancement roster. When all conditions for promotion are satisfied the sailor who qualified professionally earlier gets preference. (*b*) Does not arise, as no injustice has been done.

## වැඩ බලන ලඝු ලේඛකයින්ගේ තත්ත්වයට පත් කරනු ලැබූ ටයිප්කරුවන්

*தற்காலிக சுருக்கெழுத்தாளராக நியமிக்கப்பெற்ற தட்டெழுத்தாளர்*

TYPISTS APPOINTED AS ACTING STENOGRAPHERS

5. වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ—(පී. ජී. බී. කෙනමන් මයා. වෙනුවට)
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ—திரு. பீ. ஜி. பி. கெனமன் சார்பாக)*
(Dr. S. A. Wickremasinghe—on behalf of Mr. P. G. B. Keuneman)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1958 මැයි මාසයේ පවත්වන ලද විභාගයක ප්‍රතිඵල අනුව 1958.11.1 වැනි දින ටයිප් කරුවන් 18 දෙනෙකු වැඩ බැලීමේ තත්ත්වයක් ඇතිව ලඝු ලේඛකයින්ගේ සේවයට පත් කරන ලද බව එතුමා දන්නවාද? (ආ) මෙම නිලධාරීන් විවිධ දෙපාර්තමේන්තුවලට පත්කර යවන ලද බවත්, ඔවුන් ස්ථිර ලඝු ලේඛකයින් ඉටු කරන රාජකාරිම කරන නමුත් තවමත් ඔවුන් වැටුප් ලබන්නේ වැඩ බලන පත්වීම්වලට අදාළ පරිදි බවත් එතුමා දන්නවාද? (ඉ) මෙම නිලධාරීන් ඔවුන්ගේ තනතුරුවල ස්ථිර කිරීමට එතුමා වගබලා ගන්නවාද? නොඑසේ නම්, ඒ මන්ද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) 1958, மே மாதத்தில் நடாத்தப்பட்ட பரீட்சைப் பெறுபேறுகளின் பிரகாரம் 18 தட்டெழுத்தாளர்கள் 1.11.58 இல் பதில்நிலையில் சுருக்கெழுத்தாளர் சேவைக்கு நியமிக்கப்பட்டார்களென்பதை அவர் அறிவாரா? (ஆ) இவ்வுத்தியோகத்தர்கள் பல்வேறு திணைக்களங்களுக்கு நியமிக்கப்பட்டுள்ளன ரென்பதையும், நிரந்தர சுருக்கெழுத்தாளர்களின் அதே கடமைகளை அவர்கள் ஆற்றியுங்கூட இன்னமும் பதிற் சுருக்கெழுத்தாளர்களுக்குரிய சம்பளங்களைத் தான் தொடர்ந்தும் பெறுகின்றன ரென்பதையும் அவர் அறிவாரா? (இ) இவ்வுத்தியோகத்தர்கள் அவர்களின் பதவிகளில் உறுதிப்படுத்தப்படுவதற்கு வகை செய்யுமுகமாக அவர் நடவடிக்கைகள் மேற்கொள்வாரா? அன்றேல், ஏன்?*

asked the Minister of Finance: (*a*) Is he aware that 18 typists were appointed on 1.11.1958 to the Stenographers Service in an acting capacity, on the results of an examination held in May, 1958? (*b*) Is he further aware that these officers have been posted to various departments and, although they perform the same duties as permanent Stenographers, still continue to be paid salaries applicable to acting appointments? (*c*) Will he take steps to see that these officers are confirmed in their appointments, and if not why?

ගරු ටී. බී. ඉලංගරත්න
*(கௌரவ ரி. பி. இலங்கரத்ன)*
(The Hon. T. B. Ilangaratne)

(අ) ඔව්. ඉංග්‍රීසි ලඝු ලේඛක සේවයට බඳවා ගැනීම සඳහා අවසන් වරට විභාගයක් පවත්වන ලද්දේ 1958 දී ය. අසමත් වූ අපේක්ෂකයන් අතරින් මෙම නිලධාරීන් සෑහෙන තරම් උසස් තත්ත්වයක් ලබා සිටි නිසා ඔවුන්ට වැඩ බැලීමේ පත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වීම් පිරිනමන ලදී. (ආ) ඔව්. ඉංග්‍රීසි ලඝු ලේඛක සේවයට ඉන් පසු කිසිවකු බඳවා නො ගන්නා ලද නිසා මෙම නිලධාරීන් ඉංග්‍රීසි ලඝු ලේඛකයන් වශයෙන් වැඩ බැලීම තව දුරටත් කරගෙන යන ලදී. 1964.1.1 දින සිට ඉංග්‍රීසි ලඝු ලේඛකයන්ට සෑහෙන ප්‍රමාණයක ඉංග්‍රීසි වැඩ නොමැති විය හැකි නිසා මොවුන්ට සිංහල ලඝු ලේඛකයන් වශයෙන් ස්ථිර පත්වීම් දීම ගැන සලකා බැලීමට මා සූදානම් ය. (ඉ) ඔවුන් සිංහල ලඝු ලේඛනයේ සුදුසු කමක් ලබා සුදුසුවීමේ පරීක්ෂණයකින් සමත් වුව හොත් ඔවුන්ට ලඝු ලේඛක සේවයේ ස්ථිර පත්වීම් දෙණ ලෙස නිර්දේශ කිරීමට මා සූදානම් ය.

## චීන වෙළඳ දූත කණ්ඩායම

## *சீன வர்த்தக தூதுக்குழு*

## CHINESE TRADE DELEGATION

6. **මැතිව් මයා.**

*(திரு. மதியூ)*

(Mr. Mathew)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) (i) 1962 නොවැම්බර් මාසයේ චීන වෙළඳ දූත කණ්ඩායමක සාමාජිකයෙකුගෙන් අමෙරිකානු ඩොලර් 10,000ක් කටුනායකදී අල්ලා ගන්නා ලද බවත්, මෙම මුදල් සම්බන්ධයෙන් ඔහු රේගු බලධාරීන්ට කිසිම ප්‍රකාශයක් නොකළ බවත් ; (ii) මෙම මුදල් ආපසු දෙන ලෙස චීන තානාපති කාර්යාලයෙන් ලංකාණ්ඩුවට කරුණු සැල කර සිටි බවත් ; (iii) එසේ නොකළ හොත් ලංකාව හා චීනය අතර පවත්නා සම්බන්ධකම්වලට අහිතකර බලපෑම් සිදු වේය යන හේතුව පිට මෙම මුදල් ආපසු දෙන ලෙස රජය දැනටමත් නියෝග කර හෝ නියෝග කිරීමට ආසන්නව හෝ ඇති බවත් එතුමා දන්නවාද ? (ආ) වෙනත් රටවල ජාතිකයින් හොරෙන් මුදල් ගෙන යද්දී රේගු නිලධාරීන් විසින් අල්ලා ගනු ලැබූ විට ඒ අය සම්බන්ධයෙනුත් රජය මේ ක්‍රියා මාර්ගයම අනුගමනය කරනවාද ?

*நிதி அமைச்சரைக் கேட்ட வினா : (அ) (i) 1962, நவம்பரில், கட்டுநாயக்காவில் சீன வர்த்தகத் தூதுக்குழு அங்கத்தவ ரொருவரிட மிருந்து 10,000 ஐக்கிய நாட்டு டொலர்கள் கைப்பற்றப்பட்டன வென்பதையும், இப் பணம் சம்பந்தமாக அவர் சுங்கப்பகுதிக்கு உறுதியுரையெதுவும் செய்யவில்லை யென்பதை யும், (ii) இப்பணத்தைத் திருப்பிக்கொடுக் கும்படி வேண்டிச் சீனத் தூதுவராலயம் இலங்கை அரசாங்கத்தைக் கேட்டுக்கொண்ட தென்பதையும் (iii) இலங்கைக்கும் சீனுவுக் குமிடையிலுள்ள உறவுகளை மாருன வகையில் பாரதூரமாகப் பாதிக்குமென்ற காரணத்தை முன்னிட்டு அப்பணத்தைத் திருப்பிக் கொடுக் கும்படி அரசாங்கம் ஏற்கனவே கட்டளை யொன்றை இட்டுள்ளது அல்லது இடப்போ கின்றதென்பதையும் அவர் அறிவாரா ? (ஆ) கள்ளக்கடத்தல் காரணமாகச் சுங்கப்பகுதியி னரால் பிடிக்கப்படுகின்ற ஏனைய நாடுகளின் பிரசைகளனைவர் விடயத்திலும் இதே நடை முறையை அரசாங்கம் பின்பற்றுமா ?*

asked the Minister of Finance : (*a*) Is he aware that—(i) 10,000 U. S. dollars were seized from a member of a Chinese Trade Delegation on November 1962 at Katunayake and that he had made no declaration regarding this money to the Customs Authorities ; (ii) that the Chinese Embassy made representations requesting the Ceylon Government to refund this money ; (iii) that the Government has already made or is about to make an order that the money be returned on the grounds that it might otherwise adversely affect relations between Ceylon and China ? (*b*) Will the Government follow the same procedure in all other cases where nationals of other countries are caught smuggling by the Customs ?

**ගරු ඉලංගරත්න**

*(கௌரவ இலங்கரத்ன)*

(The Hon. Ilangaratne)

(අ) (i) ඔව්. (ii) ඔව්. (iii) නැත. (ආ) ඉහත සඳහන් (අ) (iii) හේතුවෙන් පැන නොනගී.

**මැතිව් මයා.**

*(திரு. மதியூ)*

(Mr. Mathew)

මෙවැනි හොරුන් හම ගහන්න තමුන්නාන්සෙගෙ අත් දෙක ක්‍රියාකාරී වෙන්නෙ නැද්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු
### சபை அலுவல்
### BUSINESS OF THE HOUSE

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
1 වනි යෝජනාව—

**ඩඩ්ලි සේනානායක මයා.** (දැදිගම)
*(திரு. டட்லி சேனநாயக்க—டெடிகம)*
(Mr. Dudley Senanayake—Dedigama)
There was general agreement at the discussion——

**ජේ. ආර්. ජයවර්ධන මයා.** (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)
*(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்புத் தெற்கு முதலாம் அங்கத்தவர்)*
(Mr. J. R. Jayewardene—First Colombo South)
ගරු කථානායකතුමනි, මේ ගිවිසුම කවුරුත් පිළිගත්තවද කියා මුලින්ම අපට දැන ගන්න ඕනෑ. ගිවිසුමක් තියෙනව නම් ඔක්කොම ඒකට කැමති වෙන්න එපායැ ? අපේ පක්ෂයේ නම් හැම දෙනාම කැමතියි.

**පී. පී. වික්‍රමසූරිය මයා.** (අධිකරණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)
*(திரு. பீ. பீ. விக்கிரமசூரிய—நீதியமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. P. P. Wickramasuriya—Parliamentary Secretary to the Minister of Justice)
ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙ යෝජනා තිබෙනව. කුණ්ඩසාලෙ මන්ත්‍රීතුමා නමින් යෝජනාවක් තිබෙනව. ඒක ඒ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරනවද නැද්ද කියා දැන ගන්න ඕනෑ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(டொக்டர் என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
මම කරුණාවෙන් මතක් කරන්න කැමතියි ඊයේ ඇති කර ගත් තීරණය ගැන. පක්ෂ නායකයන් රැස් වුණු අවස්ථාවෙ සභානායකතුමා එකඟ වුණා මේ යෝජනාව වෙනුවෙන් අද සම්පූර්ණ කාලය යොදවන්න. ඒ අතරම, පැය ගණනත්, කව්කයින් කවුරුන්ද යන්නත් සීමා කළා. ඉතින් ඒ විධියෙ එකඟත්වයක් අරන් දැන් මේ විධියට කියනව නම් මොකක්ද වෙන්නෙ ?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
එතකොට වරින්වර තමුන්නාන්සෙගෙ කාමරයට එන්නෙයි කියල අපට ආරාධනා කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය මොකක්ද කථානායකතුමනි ?

**යූ. පී. වයි. ජිනදාස මයා.** (කුණ්ඩසාලෙ)
*(திரு. யூ. பீ. வை. ஜினதாஸ—குண்டசாலே)*
(Mr. U. P. Y. Jinadasa—Kundasale)
ගරු කථානායකතුමනි, මේක බොහොම වැදගත් යෝජනාවක්. දැන් අවුරුදු තුනක් පමණ කාලයක ඉඳල මේ යෝජනාව ගැන මා උත්සාහ ගත්ත. මේ යෝජනාව ගැන පසුගිය අවුරුදු දෙක තුනක ඉඳල උනන්දුවක් දක්වා ක්‍රියා කරගෙන ආ බව ආණ්ඩු පක්ෂයේ මෙන්ම විරුඬ පාර්ශවයේත් ගරු මන්ත්‍රීවරුන් දන්නව. මේ විධියේ කාරණයක් ගැන තීරණයක් ගන්න ඉස්සර වෙලා අපෙන් අහන්න ඕනෑ. අපේ ගරු සභානායකතුමා තමයි පල්ලෙකැලේ වත්ත සම්බන්ධයෙන් කටයුතු කරන්න ඉන්නෙ. ඒ නිසා මේ යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාවක් මට වුවමනා කරනවා. මම මේ යෝජනාව ඉල්ලා අස් කර ගන්න කැමති නැහැ.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)
කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව නම් පල්ලෙකැලේ වත්ත ආණ්ඩුවට ගන්නය කියන එකයි. විරුද්ධ පාර්ශ්වයේ අපි කිසිවෙක් ඊට විරුද්ධ නැහැ. ඒ නිසා ආණ්ඩු පක්ෂයත් කැමති නම් ඒ යෝජනාව ඉදිරිපත් කර සම්මත කර ගන්ට පුළුවන් ; වැඩි කථාවක් වුවමනා කරන්නෙ නැහැ.

**ජිනදාස මයා.**
*(திரு. ஜினதாஸ)*
(Mr. Jinadasa)
කථාව ටිකක් හරි ගෙන යන්ට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

**ඩඩ්ලි සේනානායක මයා.**
*(திரு. டட்லி சேனநாயக்க)*
(Mr. Dudley Senanayake)

ගරු කථානායකතුමනි, එකඟ වූ කාරණයකට විරුද්ධව වෙන මාර්ගයකින් කට යුතු කරනව නම් ඒක වෙනම දෙයක්. අපි ලෑහැස්තියි, කිසි විරුද්ධත්වයක් නැතිව ඒ යෝජනාව සම්මත කර ගන්න ඉඩ හරින්න.

**වික්‍රමසූරිය මයා.**
*(திரு. விக்ரமசூரிய)*
(Mr. Wickramasuriya)

එහෙම නම් හැම යෝජනාවම විවාදයක් නැතිව ස්ථිරවන්ට ඕනෑ. එහෙම්ද මෙපමණ කල් සිදු වුණේ? අපි ඉක්මනින් වාදය ඉවර කරණවා කියා දවස් ගණන් කථා කරනව. ඒ මන්ත්‍රීතුමාට කථා කරන්ට ඉඩ තිබෙන්න ඕනෑ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(டொக்டர் என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමා කියනවාද, පක්ෂ නායකයින් සාකාච්ඡා කරන අවසථා වලදී, ඒ සැම දෙනාගේම අවසර අරගෙන සාකච්ඡා කරන්න ඕනෑ කියා? එසේ නම් සභානායකතුමා සමග සාකච්ඡා කිරීමෙන් ප්‍රයෝජනයක් තිබෙනවා දැයි අපි දන්නෙ නැහැ.

**ජිනදාස මයා.**
*(திரு. ஜினதாஸ)*
(Mr. Jinadasa)

හැම මන්ත්‍රීවරුන්ගෙන්ම අවසර ගන්නය කියා මා කියන්නෙ නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(டொக்டர் என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

මා හිතන්නෙ සභානායකතුමා කථා කරන්නෙ මුළු ආණ්ඩු පක්ෂයම වෙනුවෙන් කියායි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඊයේ මා ඒ ගරු මන්ත්‍රීවරුන් කියන විධියේ පොරොන්දුවක් දුන්නෙ නැහැ. [බාධා කිරීමක්] මා ඊයේ කියා සිටියේ පුවත් පත් කොමිසම පිළිබඳ යෝජනාව පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනාවල අන්තිම කොණට දමන්ට පුළුවන්ය, ඒ ගැන සාකච්ඡා කරන්ට පුළුවන් වන්නෙ යෝජනා ඉදිරිපත් කර තිබෙන අනික් මන්ත්‍රීවරුන් සියලු දෙනාගේම කැමැත්ත ලැබුණොත් පමණක්ය, කියන එකයි. මට ඒ සම්බන්ධයෙන් පොරොන්දු වන්ට බැරි බව මා ඊයේ කියා සිටියා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டி. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු කථානායකතුමනි, විරුද්ධ පක්ෂ වල නායකයන් සියලු දෙනාම තමුන්නාන්සේගේ කාමරයට පැමිණ මේ කාරණය සම්බන්ධයෙන් තීරණයකට බැසිය යුතු යයි මේ සභාවේදී තීරණය වුණා. ඒ තීරණය අනුව අද මේ පිළිබඳව තමුන්නාන්සේලා සාකච්ඡා කරනවාය කියා ඊයේ පොරොන්දු වුණා. ඊට පසුව දෙවෙනි එකක් ආව. අපි මේ කාරණය ගැන කල්පනා කරමු. තමුන්නාන්සේලා හැම පක්ෂවලම නායකයන් කැඳවනවා යම් යම් ප්‍රශ්න සම්බන්ධයෙන් තීරණ වලට බහින්ට. තත්ත්වය මෙහෙම නම් ඒ විධියේ සාකච්ඡාවලින් පලක් නැහැ. මින් මතුවටත් එවැනි සාකච්ඡාවලින් පලක් නැහැ, මේ අන්දමට කටයුතු කෙරෙනවා නම්.

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා.** (මහියංගන)
*(திரு. சி. பீ. ஜே. செனவிரத்ன—மஹியங்கனை)*
(Mr. C. P. J. Seneviratne—Mahiyangana)

මේ සම්බන්ධයෙන් පොරොන්දුවක් දුන්නෙ නැතැයි සභානායකතුමා කියනව නම්, මේ පිළිබඳව අද රාත්‍රි 9 ට ඡන්දයක් විමසන්න යනවාය මන්ත්‍රීවරුන් සියලු දෙනාම පැමිණෙන්නය කියා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ටෙලිග්‍රෑම් යැව්වේ ඇයි?

**ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)
*(திரு. ரி. பி. எம். ஹேரத்—வளப்பனை)*
(Mr. T. B. M. Herath—Walapane)

ගරු කථානායකතුමනි, 21 වැනි ස්ථාවර නියෝගයේ 6 වැනි සහ 7 වැනි ශීර්ෂ වල සඳහන් වී තිබෙනවා, පෞද්ගලික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හේරත් මයා.]
යෝජනා සම්බන්ධයෙන්. මා දැනගන්ට කැමතියි, පක්ෂ නායකයින් යම් යම් තීරණ ගන්නේ මේ ස්ථාවර නියෝගව ලට යටත්වද කියා. මේ ස්ථාවර නියෝග උල්ලංඝනය කරන්නටත් පක්ෂ නායක යින්ට බලයක් තිබෙනවද කියාත් මා දැන ගන්නට කැමතියි. අපි යම්කිසි කාර ණයක් ඉටු කර ගන්ට මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කළ විට ඒ යෝජ නාව ගැන සාකච්ඡා කරන්ට නිත්‍යානුකූ ලව අපට තිබෙන නිදහස නැති කිරීම සඳහා කටයුතු කරන්ට කථානායකතුමාට හෝ වෙන කිසි කෙනකුට හෝ ඉඩ දෙන්ට අපි ලැහැස්ති නැහැ. එය කිසි කෙනකුට පාවා දෙන්ට අපි ලැහැස්ති නැති බව මතක් කරන්ට කැමතියි. පක්ෂ නායක යින්ගේ තීරණ හැමදාම උල්ලංඝනය කළේ, කැඩුවේ, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුයි.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)
නැහැ, නැහැ.

**හේරත් මයා.**
*(திரு. ஹெரத்)*
(Mr. Herath)
අපි කවදාවත් පක්ෂ නායකයින්ගේ තීරණවලට විරුද්ධ වුණේ නැහැ. අද අපි කියනව, 21 වැනි ස්ථාවර නියෝගයේ 6 වැනි සහ 7 වැනි ශීර්ෂ යටතේ මේ ගරු සභාවට තිබෙන බලය උඩ මන්ත්‍රීවරුන් ගේ යෝජනාවලට ඉඩ දෙන්න කියා. පල්ලෙකැලේ වත්ත පිළිබඳව අප ඉදිරි පත් කර තිබෙන්නේ ඉතා වැදගත් යෝජනාවක්. ඒ යෝජනාව පිළිබඳ සාකච්ඡාව සුළු වේලාවකින් අවසාන කර, ඉතුරු වැඩ කරගෙන යන්ට අපට අවස් ථාව ලැබෙනවාට කිසිම අඩමානයක් නැහැ.

**වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාදන් (නල්ලූර්)**
*(டொக்டர் ஈ. எம். வி. நாகநாதன்—நல்லூர்)*
(Dr. E. M. V. Nagathan—Nallur)
I think that there is some misunderstanding about this whole matter. This Motion with regard to the Commission of Inquiry on the Press and a few other Motions have not been assigned any dates. These Motions are signed by practically all the leaders of parties in the Opposition. Though they are classified as Private Members' Motions they bear the signatures of all leaders of Opposition parties and specific dates are arranged for their discussion with the consent of the Hon. Leader of the House.

Yesterday in your Chambers we discussed this matter with the Hon. Leader of the House and he said that he felt that he could get his party members to withdraw their Motions so as to give us a chance of discussing the Motion with regard to the Press Commission today. The matter would have been settled but for the interference of the hon. Parliamentary Secretary to the Minister of Justice who purposely sabotaged the whole thing.

**වික්‍රමසූරිය මයා.**
*(திரு. விக்ரமசூரிய)*
(Mr. Wickramasuriya)
I did not—[*Interruption*].

**වෛද්‍යාචාර්ය නාගනාදන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)
You did.

**වික්‍රමසූරිය මයා.**
*(திரு. விக்ரமசூரிய)*
(Mr. Wickramasuriya)
What nonsense! I did not.—[*Interruption.*]

**වෛද්‍යාචාර්ය නාගනාදන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)
He sabotaged the whole thing—[*Interruption*]. He put up Government Members to insist that their Motions be taken up today when earlier they were quite prepared to withdraw.

A Motion such as this—also the Motion with regard to the C. W. E.—which bears the signature of practically all leaders of Opposition parties,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

although it is not a Government Motion, cannot rightly be called a Private Member's Motion. A date is not assigned to this kind of Motion as the date has to be fixed in consultation with the Hon. Leader of the House. Yesterday we met in your Chambers and decided that the date shall be today and we got an undertaking from the Hon. Leader of the House that all Motions put forward by Government Members will be withdrawn. He gave us that undertaking, the hon. Members should have abided by that undertaking, which is Parliamentary tradition. I am sorry to say that the hon. Parliamentary Secretary to the Minister of Justice has induced his men to—[*Interruption.*]

ගරු මන්ත්‍රීවරු
(கௌரவ அங்கத்தவர்கள்)
(Hon. Members)

Withdraw ! Withdraw !!

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

Order, please ! You must withdraw that.

වෛද්‍යාචාර්ය නාගනාදන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

No, Sir. It is a most shameful thing for him to do.

වික්‍රමසූරිය මයා.
(திரு. விக்ரமசூரிய)
(Mr. Wickramasuriya)

It is a most shameful thing for you to speak like that.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I wish to contradict the hon. Member for Nallur. I said that all the Members may not withdraw their Motions. I request that the hon. Member for Nallur to withdraw the allegation he made against the hon. Parliamentary Secretary to the Minister of Justice.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

Order, please ! The hon. Member for Nallur must withdraw his remark.

වෛද්‍යාචාර්ය නාගනාදන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

No, Sir. I will repeat that.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ කාමරයේ පැවති මේ සාකච්ඡාවට සහභාගි වූ කෙනකු හැටියටත්, මුල සිට අග දක්වාම ඒ සාකච්ඡාවේ සිටි කෙනකු හැටියටත් මට වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩ දෙන මෙන් ඉල්ලා සිටිනවා. සභානායකතුමා කියනවා, ඒ සාකච්ඡාවේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කවුරුවත් තමන්ගේ නමින් තිබෙන යෝජනා ඉදිරිපත් කරන්නේ නැත කියන ස්ථිර පොරොන්දුවක් දුන්නේ නැත කියා. එහෙම නම් මා සභානායකතුමාගෙන් එක ප්‍රශ්නයක් අසනවා. තත්ත්වය එහෙම නම්, අද දින රෑ නවය දක්වා වැඩ කර ඡන්දය ගන්නත්, එක පක්ෂයකින් එක කථිකයකු කථා කරන්නත්, එක කථිකයකු පැය භාගයක් කථා කරන්නත්, ආණ්ඩු පක්ෂයෙන් හතර දෙනකුට කථා කරන්නත් ආදී වශයෙන් මේ විගඩමක් කථා කරන්ට තමුන්නාන්සේ ඉඩ දෙන්නේ මක්නිසාද කියා මා ප්‍රශ්න කරනවා.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You agreed to go on till 9 o'clock.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I said definitely that we cannot sit late.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You agreed to go on till 9 o'clock. It was agreed that only one speaker from each Opposition party was to speak; only one speaker from the Government and four speakers from the Opposition were to speak. All those details were agreed to. Otherwise, the Hon. Leader of the House need not have discussed all these details. It was also agreed that we limit the speeches to half an hour each. All the details were discussed, and it is most unfair that the Hon. Leader of the House should behave in this way—[*Interruption*].

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

Mr. Speaker, before we move on, will the Hon. Leader of the House give us an early date?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

He is not prepared to give a date now.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

A Government day?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

In order to enable them to carry on their work we agreed to forgo Private Members' Day for a Motion which normally requires the Government's special consideration. Under the normal arrangement of business this would have required the Government giving a special date; but we were prepared, in view of heavy Government business, to allocate Private Members' Day for this Motion. That amount of consideration we gave. Now, give us the opportunity of having a special day for discussing it.

මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

What does the Hon. Leader of the House say about it? Will you give us tomorrow for this? We were willing to forgo Private Members' Day. Now give us a Government day.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

The Hon. Minister of Finance wants to discuss the Finance Bill tomorrow. We got two or three other urgent things like the Bribery Bill.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

What is the urgency about the Bribery Bill?

වික්‍රමසූරිය මයා.
(திரு. விக்ரமசூரிய)
(Mr. Wickramasuriya)

There are about 100 cases pending.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

May I suggest that this Motion be taken up after the hon. Member for Kundasale has moved his Motion?—[*Interruption*].

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

What about the other Members whose Motions appear before that of the hon. Member for Kundasale?

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

The hon. Member for Kundasale's Motion is the 13th Motion on the Order Paper.—[*Interruption*.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

Will the Government give us a date ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

We will give a date.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

Tomorrow ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

As I have already said, there is the Finance Bill tomorrow. This can be taken up immediately after the Finance Bill is over.

වික්‍රමසූරිය මයා.
(திரு. விக்ரமசூரிய)
(Mr. Wickramasuriya)

What about the Bribery Bill ?

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

Now he wants to add his proviso.

වික්‍රමසූරිය මයා.
(திரு. விக்ரமசூரிய)
(Mr. Wickramasuriya)

It is urgent.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

I suppose the urgency is about the six persons who were found guilty.

Then is it understood that immediately after the Finance Bill we will discuss the Motion on the Commission of Inquiry on the Press ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Yes.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

There is no mover in respect of Motion Nos. 1 to 4.

## ලංකාවේ සිටින ඉන්දියානුන් ආපසු ඉන්දියාවට යැවීම

இலங்கையிலுள்ள இந்தியர்களைத் தாய் நாட்டுக்குத் திருப்பியனுப்பல்

REPATRIATION OF INDIANS IN CEYLON

කේ. එම්. පී. රාජරත්න මයා. (වැලිමඩ)
(திரு. கே. எம். பீ. ராஜரத்ன—வெலிமடை)
(Mr. K. M. P. Rajaratna—Welimada)

ගරු කථානායකතුමනි, අද අපි මේ සභාවට පැමිණියේ ඊයේ ඔබතුමා සමග පැවති සාකච්ඡාවකින් පසුවයි. විරුද්ධ පාර්ශ්වයේ හැම කණ්ඩායමක්ම වගේ අත්සන් තබන ලද, ප්‍රවෘත්ති පත්‍ර කොමිසම සම්බන්ධ යෝජනාව සාකච්ඡා කිරීමටයි ඒ සාකච්ඡාව පැවැත්වූයේ. ඒ අවස්ථාවේදී සභානායකතුමා ප්‍රතිඥාවක් දුන්නා ; කථා කරන කථිකයන් නියම කළා ; අද රෑ නවයට වැඩ කටයුතු අවසාන කරන්ට ඕනෑයයි කිව්වා. නමුත් අද ගරු සභානායකතුමා ඒ ප්‍රතිඥාව කැඩුවා.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

ඒක අත්හැර මේ යෝජනාව ගැන සාකච්ඡා කරන්න.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

කථානායකතුමනි, ඔබතුමා දන්නවා මා එය කැඩුවාද නැද්ද කියා.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

කැඩුවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

දැන් ඒක ගැන සාකච්ඡා කළා නේ. කරුණා කර යෝජනාව ඉදිරිපත් කරන්න.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මම යෝජනාව ඉදිරිපත් කරනවා. එය කාටවත් නතර කරන්ට බැහැ. ඒ ප්‍රතිඥාව කැඩූ නිසා—[බාධා කිරීමක්] මගේ නමින් තිබෙන යෝජනාව මා ඉදිරිපත් කරනවා. මේ යෝජනාවට අදාළව සභානායකතුමා ගැන කරුණු කීපයක් කියන්ට අපි බලාපොරොත්තු වෙනවා. නමුත් එතුමා පිට වී යන එක ගැන කනගාටුයි. කෙසේ වෙතත්, මගේ යෝජනාවට ප්‍රථමයෙන් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකුගේ යෝජනාවක් තිබෙනවා. ඒ මන්ත්‍රීතුමා නැති නිසා මේ අවස්ථාවේදී මම මගේ යෝජනාව ඉදිරිපත් කරනවා. යෝජනාව ඉදිරිපත් කරන්න පෙර මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා මේ කාරණය. පොඞ්ඩක් හෝ අවංකකමක් තිබෙනව නම්—සභානායකතුමා අද හැසුරුණු ආකාරය ගැන බලන විට අපට හිතෙන්නෙ නැහැ, පොඞ්ඩක්වත් අවංකකමක් තියෙනවය කියා—මේ යෝජනාව සම්බන්ධයෙන් අදම ඡන්දයක් විමසීමට කටයුතු කරමු. මේ යෝජනාව ලිස්සා යන්න ඉඩ දෙන්න එපා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව රට හැම තැනම ගොස් ඉන්දියානු ප්‍රශ්නය පිළිබඳව මහජනතාව මුළා කරන්න කථා කරන නමුත් මේ ප්‍රශ්නය විසඳීමට වැඩ කටයුතු කිසිවක් නොකර තිබෙන නිසා——

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා. (නිවිතිගල)**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட—நிவிதிகல)*
(Mr. Stanley Molligoda--Niwitigala)

දැන් ප්‍රශ්නය විසඳා ඉවරයි. විසඳන්න දෙයක් නැහැ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

නිවිතිගල මන්ත්‍රීතුමාගෙ හිතෙන් නම් ප්‍රශ්නය විසඳල ඉවරයි. නමුත්——

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

නැහැ, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

කරුණා කර නිශ්ශබ්ද වන්න.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, මගේ යෝජනාව මම දැන් ඉදිරිපත් කරනව. එය කියවෙන්නෙ මේ විධියටයි :

"බ්‍රිතාන්‍ය අධිරදවැද්දන් මෙරටට ගෙනා ඉන්දියානුන් හා මෙරටට හොරෙන් වදින ඉන්දියානුන් යැවීම සඳහා ලංකා අගමැතිනිය හා ඉන්දීය අගමැති අතර සාකච්ඡා ඇරඹීමට පෙර ආණ්ඩුව පහත සඳහන් පියවර වහාම ගත යුතුයැයි මේ සභාවේ අදහසයි :—

(අ) මේ ප්‍රශ්නය ගැන අවබෝධයක්, හැඟීමක් හා උනන්දුවක් ඇතිකර ලීම සඳහා ජාතික මහජන ව්‍යාපාරයක් ඇරඹීම.

(ආ) යම්කිසි රටකට අයුක්තියක් හා අසාධාරණයක් ඉතිහාසයෙන් සිදු වුවහොත් ඒ ඓතිහාසික අසාධාරණය හා අයුක්තිය මකා දැමිය යුතුය යන ලෝක සම්මත නීතිය අනුව, ඉන්දියානුන් ලංකාවට ගෙන ඒමෙන් හා ඔවුන් මෙරටට හොරෙන් වැදීමෙන් ලංකාවට කර තිබෙන ඓතිහාසික අයුක්තිය හා අසාධාරණය මකා දැමීම් වස් ඉන්දියානු ආණ්ඩුව හැම ඉන්දියානුවෙක්ම ඉන්දියාවට ගෙන්වා ගත යුතුයයි බල කෙරෙන බලගතු ලෝක මතයක් ඇති කිරීම සඳහා ප්‍රගතිශීලී ප්‍රතිපත්ති අනුගමනය කරන ලෝකයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආණ්ඩු හා දේශපාලන ව්‍යාපාර අතර මේ ප්‍රශ්නය ගැන පැහැදිලි අවබෝධයක් ලබා දීම හා විශේෂයෙන් ම, පකිස්තානය, බුරුමය, ඉන්දුනීසියාව, කාම්බෝජය, ලාඕසය, උතුරු වියට්නාමය, තායිලන්තය හා චීනය වැනි ආසියාතික රටවල රාජ්‍ය හා දේශපාලන නායකයන්ගේ සම්මේලනයක් කැඳවීම.

(ඈ) ඉන්දියානුන්ට දෙනු ලබන සහල් හා ආහාර සලාකය කැපීම.

(ඈ) පුරවැසි නොවූ කිසිවෙකු දේශපාලන පක්ෂ වලට වැදීම, දේශපාලන කටයුතුවල නිරත වීම හා ඒවාට ආධාර දීම, වෘත්තීය සමිතිවලට බැඳීම හා ඒ කටයුතුවල නිරත වීම තහනම් කිරීම.

(ඉ) දකුණු ඉන්දියාවේ දේශපාලන පක්ෂයක්වූ ද්‍රවිඩ මුන්නේත්‍ර කලාගම් සංවිධානයේ ශාඛා ලංකාවේ පිහිටුවීම, ඒ කටයුතුවල නිරතවීම යනාදිය තහනම් කිරීම, හා ද්‍රවිඩ මුන්නේත්‍ර කලාගම් සංවිධානයේ පොත්පත්, සඟරා, චිත්‍රපටි ලංකාවට ගෙන්වීම තහනම් කිරීම.

(ඊ) ලංකාව දෙකඩ කිරීම, ලංකාවේ වෙනම දෙමළ රාජයක් පිහිටුවීම ගැන කථා කිරීම, ඒ ගැන ප්‍රචාරය කිරීම, ඒ සඳහා සංවිධානය වීම දේශද්‍රෝහි රාජ්‍යද්‍රෝහී ක්‍රියාවන් හැටියට නීතියෙන් නම් කොට ඒ නීතිය කඩන්නන්ට බරපතල දඬුවම් පැනවීම.

(උ) විදේශකයන් හා සම්මාන පුරවැසියන් වෙළඳාමෙහි නිරතවීම, රැකියාවල් ලබා ගැනීම, ඉඩකඩම් මිලයට ගැනීම තහනම් කිරීම.

(ඌ) සම්මාන පුරවැසිකම් අහෝසි කිරීම."

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා (බොරැල්ල)**

*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா—பொறளை)*

(Dr. W. D. de Silva—Borella)

On a point of Order, there is no Quorum.

**මන්ත්‍රීමණ්ඩලය ගණන් කොට, ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, දැනට මේ රටේ තිබෙන ඉතාමත් බරපතල වූත්, ඉතාමත් වැදගත් වූත්, ඉක්මනින් විසඳිය යුතු වූත් ප්‍රශ්නය නම් ඉන්දියානු ප්‍රශ්නයයි. මේ ප්‍රශ්නය ගැන නොයෙකුත් දෙනා නොයෙකුත් මත ප්‍රකාශ කරනවා. නොයෙකුත් දෙනා නොයෙකුත් විධියට මේ ප්‍රශ්නය විස්තර කරනවා. ඉන්දියානුවන් 8 ලක්ෂයක් පමණ මේ රටේ සිටින බවද මේ රටේ ජනගහණය අනුව බලන විට එය ඒ තරම් කාරණයක් නොවන බවද සමහරු කියනවා. නමුත් මේ ප්‍රශ්නයේ ස්වභාවය දෙස ඕනෑකමින් බලා හරි සංඛ්‍යාලේඛන පිළියෙළ කළොත් ඉන්දියානුවන් 20 ලක්ෂය කටත් වැඩිය දැනට මේ රටේ සිටින බව පෙනී යනවා ඇති. ඒ වගේම දිනෙන් දිනම ඉන්දියානුවන්ගේ සංඛ්‍යාව වැඩි වෙනවා. එසේ වැඩි වන්නේ ස්වාභාවික කරුණු හේතුකොට ගෙන නොවෙයි. අස්වාභාවික ලෙස ඉන්දියානුවන්ගේ සංඛ්‍යාවෙහි ශීඝ්‍ර වැඩි වීමක් තිබෙනවා. එසේ වැඩි වන්නේ දහස් ගණන් ඉන්දියානුවන් හොරෙන් මේ රටට පැමිණීම නිසයි. ආණ්ඩුවත් නොයෙකුත් අවස්ථාවල දී මේ තත්ත්වය පිළිගෙන තිබෙනවා. මා මුලින් කීවාක් මෙන් නොයෙකුත් අදහස් ප්‍රකාශ කර ඇතත් මේ රටේ බහුතර ජනතාවගේ අදහස වී තිබෙන්නේ හැකිතාක් ඉක්මනින් මේ ඉන්දියානුවන් 20 ලක්ෂය ආපසු ඉන්දියාවට යැවීමට කටයුතු යෙදිය යුතු බවයි. බහුතර සංඛ්‍යාවගේ ඉල්ලීම ඒකයි. මේ රටේ මහජන මතය ඒකයි. 1956 දී බණ්ඩාරනායක මහතාට මේ රටේ බලය අල්ලා ගන්නට පුළුවන් වුණේ ඒ මහජන මතය බණ්ඩාරනායක මහත්මයා පිළිගත් නිසයි. "අන්තිම ඉන්දියානුවාත් ලංකාවෙන් පිට වූ දාටයි මට සැප නින්දක් යන්නේ" කියලයි එදා බණ්ඩාරනායක මහත්මයා කීවේ. නමුත් දැන් ඇති වී තිබෙන්නේ ඊට වෙනස් තත්ත්වයක්. බණ්ඩාරනායක මහත්මයා දැන් සැප නින්දක් ලබනවා. නමුත් ඉන්දියානුවින් දිනපතාම දහස් ගණනින් ලංකාවට පැමිණෙනවා. දැන් හොර ඉන්දියානුවන්ගේ පැමිණීම වැඩියි. ඉන්දියානු ප්‍රශ්නය විසඳන බවට බණ්ඩාරනායක මහතා එදා මහජනයා ඉදිරියේ පොරොන්දු වූ නමුත් ඇත්තෙන්ම එතුමා මේ ප්‍රශ්නය බැරරුම් කරන්ට, ව්‍යාකූල කරන්ට පියවර කීපයක් ගත් බව කිව යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය නාගනාදන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

On a point of Order, Mr. Speaker, we cannot proceed without a Quorum.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට, ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයෙදි මෙම ප්‍රශ්නය ව්‍යාකූල වන ආකාරයට පියවර කිපයක් ගත් බවයි, මා කියමින් සිටියෙ. මා එය පසුව පැහැදිලි කරන්න බලාපොරොත්තු වෙනව. විස ලක්ෂයකට අධික ඉන්දියානුන් පිරිසක් මේ රටේ සිටීම නිසා මේ රටෙ පැනනැගී තිබෙන භයානක ප්‍රශ්න බොහොමයක් තිබෙනව. ආර්ථික වශයෙන්, ජාතික වශයෙන්, දේශපාලන වශයෙන් සහ සංස්කෘතික වශයෙන් භයානක ප්‍රශ්න පැනනැග තිබෙනව. මේ ප්‍රශ්න අපේ රටේ පැවැත්මට පහර ගසන ප්‍රශ්නයි. ඒවා බරපතළයි; භයානකයි.

ගරු කථානායකතුමනි, ඉතිහාසය ගැන දන්න කවුරුත් දන්නවා ඇති ඉන්දියානු ජාතිකයන් මේ රටට පැමිණියේ කුමන කරුණක් නිසාද කියන එක. මේ රටේ ජනතාවගෙ ඉල්ලීමක් උඩ ඉන්දියානුන් මේ රටට පැමිණියෙ නැහැ. මේ රටේ මහ ජන ඕනෑකමක් උඩ ඔවුන් මේ රටට පැමිණියෙ නැහැ. අවුරුදු සියයකට තරම් පෙර ඔවුන් මේ රටට ගෙන්ව ගත්තෙ අධිරාජ්‍යවාදීන් විසිනුයි. ඔවුන්ගෙ ආර්ථික ක්‍රම—ගොවිතැන් සහ වතු ව්‍යාපාර යනාදිය—තහවුරු කර ගැනීම සඳහායි, ඉන්දියානුන් මෙරටට ගෙන්නුවෙ. ඉන්දියානුන් මේ රටට ගෙන්වා ගැනීම ගැන ජනතාවගෙ විරෝධය පල වී තිබෙන්නෙ අද ඊයෙ පමණක් නොවෙයි; එදා පටන්ම විරෝධය පැනනැගුණා. ඉන්දියානු ප්‍රශ්නය සුළු ප්‍රශ්නයක් හැටියට හඳුන්වන අය කියන්නෙ ඉන්දියානුන්ගෙ වරදක් නැති බවයි. අධිරාජ්‍යවාදීන් විසින් ගෙන්වූ බවයි ඔවුන් කියන්නෙ. ඉන්දියානුන් අහිංසක කොටසක් හැටියට ඔවුන් හඳුන්වනව. එම නිසා ඔවුන්ට මානුසික අයිතිවාසිකම් දිය යුතු බවයි ඒ පිරිස කියන්නෙ. අධිරාජ්‍ය වාදීන්ගෙ වුවමනාකම් සඳහා පැමිණියත් මෙරටට පැමිණෙන විටම ඉන්දියානුන් දැනගෙන සිටිය එසේ පැමිණෙන්නෙ කුමන කරුණක් නිසාද කියන එක. ඇස් වහල, අත පය බැඳල, කිසි දෙයක් හිතන්න බැරි වෙන්න පෙට්ටිවල පටවල, සීල් තබල ඔවුන් මේ රටට ගෙනාවෙ නැහැ.

ඔවුන් අද මෙන්ම එදාත් ආර්ථික තත්ත්වයෙන් ඉතා භයානක ලෙස පිරිහී සිටි නිසා, කෑම බීම ඇඳීම පහසුවෙන් ලබා ගැනීමට බැරි වූ නිසා, රැකි රක්ෂා ලබාගැනීමට තුබූ මහත් දුෂ්කරතාවය නිසා, මිල මුදල් නැතිකම නිසා, ගොවකමක් කර්මට වත නියම වාරිමාර්ග නොතුබුණු නිසා, භාමතෙ මැරෙන තට වන නිසා, මෙහි පැමිණීම ස්වර්ගයකට පැමිණීමක් ලෙස සලකා එදා අධිරාජ්‍යවාදීන්ගේ ඉල්ලීම එක හෙළාම ඉටු ක්‍රමට ඉදිරපත් වුණා. එදා ඒ අනුව දහස් ගණනින් ඉන්දියානුවන් මේ රටට පැමිණියා. මුල් අවධියෙ පටන් අද වන තුරුත් පැමිණි ඉන්දියානුවන් අධිරාජ්‍යවාදීන්ගේ බලකිරීම උඩ පැමිණි පිරිසක් හැටියට සිතීම වැරදියි. ඔවුන් රක්ෂා සොයාගෙන පැමිණි බව ඓතිහාසික කාරණයක්. ඔවුන් පැමිණ ඇත්තේ මේ රටේ මිනිසුන්ට ලැබිය යුතු රක්ෂා ඔවුන්ට ලබා ගැනීමට ඉඩ නොදී, මෙරට වැස්සා ආර්ථික පරිහානියට පත් කොට තමන්ට රක්ෂා ලබාගෙන තමන්ගේ පෝෂණය සඳහායි. 1848 වන විට ඉන්දියානුවන් සංඛ්‍යාවක් මේ රටේ සිටියා.

1848 ට අවුරුදු හත අටකට පමණ ප්‍රථම—1833 න් පසුව—කෝල්බෲක් කොමිසන් වාර්තාවේ නිර්දේශයන් පිළිගත්තාට පසුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලංකාවේ සිටින ඉන්දියානුන් ආපසු ඉන්දියාවට යැවීම

ඇති වූ තත්ත්වය අනුව මේ රටේ ජනතාවට අයිතිව තිබුණු ඉඩ කඩම් සුදු අධිරාජ්‍යවාදීන් විසින් තුට්ටුවට දෙකට ලබාගෙන ඔවුන්ගේ වැවිලි කර්මාන්තය දියුණු කිරීමට පටන් ගත්තා. කිසිත් හැල් හොල්මනක් නැතිව මේ රටේ ගැමි ජනතාවට අයත්ව තුබුණු ඉඩම් සුදු අධිරාජ්‍යවාදීන් විසින් මංකොල්ල කෑමේ විශාල ව්‍යාපාරයක් ඇති වුණා. එසේ මංකොල්ල කා ගත් ඉඩම්වල කෝපි වැවීම සඳහා ඉන්දියානුවන් ගෙන්වා ගත්තා.

1848 දී දෙවන ජාතික සටන ඇති වුණා. ගොංගාලේගොඩ බණ්ඩා, මොරටුවේ පුරන් අප්පු, කුඩාපොළ ස්වාමීන් වහන්සේ ආදී ගිහි පැවිදි පින්වතුන්ගේ, වීරවරයින්ගේ, නායකත්වයෙන් 1848 දී මාතලේදී දෙවන ජාතික සටන ආරම්භ වුණා. මොන කාරණා නිසාද, එය ඇති වූයේ? ක්ෂණික හේතුවක් වූයේ බදු වැඩි කිරීමයි. ඉංගිරිසි අධිරාජ්‍යවාදීන් එදා ඉතා අසාධාරණ බදු අය කිරීමට පටන්ගත්තා. නමුත් ඒ සටනට මූලික කාරණා දෙකක් හේතු වුණා. ඉන් පළමුවැන්න, මේ රටේ සිටි ගැමියන්ට අයත්ව තුබුණු ඉඩ කඩම් ඉංගිරිසි අධිරාජ්‍යවාදීන් විසින් මංකොල්ල කෑමට පටන් ගැනීමයි. දෙවන හේතුව, ගැමියන්ගෙන් මංකොල්ලකා ගත් ඒ ඉඩම් වැවීමේදී මේ රටේ සිංහල ගැමියන්ට රක්ෂා නොදී ඒ සඳහා දකුණු ඉන්දියාවෙන් දහස් ගණන් ඉන්දියානු ජාතිකයින් මේ රටට ගෙන්වා ගැනීමයි.

අධිරාජ්‍යවාදීන් ඒ මුල් යුගයේදී මේ රටට ඉන්දියානුවන් ගෙන්වීම ගැන අද මෙන්ම මේ රටේ ජනතාව සදා විරුද්ධ වුණා. ඒ බව ප්‍රකාශ කළා. ඊට විරුද්ධව සටන් කළා. 1848 දී ඇති වුණු සටනේදී ඉන්දියානු ජාතිකයින් සුදු අධිරාජ්‍යවාදීන් සමඟ එකතු වී මේ රටේ සිටි ජාතික වීරයින්—කුඩාපොළ ස්වාමීන් වහන්සේ වැනි වීරයින්—මරා දැමීමට, විනාශ කිරීමට, සුදු අධිරාජ්‍යවාදීන්ට දෙන්නට පුළුවන් සෑම උපකාරයක්ම දුන් බවට ඉතිහාසය සාක්ෂි දරනවා. ඊට පසුව සුදු අධිරාජ්‍යවාදීන් විසින් මේ රටට ඉන්දියානුවන් ගෙන්වීම කිසිත් සීමාවක් නැතිව කරගෙන ගියා. මෙහිදී එක් වැදගත් කාරණයක් මතක් වුණා. දැන් අවුරුදු තුන හතරකට පෙර ගරු සභානායකතුමා එක්තරා අදහසක් ප්‍රකාශ කළා. දැනටත් එතුමාගේ අදහස ඒකයි. මොකක්ද? ජාතික ධනය ඉන්දියානුවන් නිපදවනවා. එම නිසා ඒ අයට හිරහැර කිරීම නුසුදුසුය කියා කියනවා. රත්තරන් බිජු දාන කිකිළිය මරන එක වැරදියි. අපේ සභානායකතුමාගේ අදහස මේකයි. මේ අදහස අනුවයි එතුමා පියවර ගණනාවක්ම අරගෙන තිබෙන්නෙ. එතුමාගෙ අදහස නම්, ඒ අය ජාතික ධනය නිපදවා තිබෙනවා, අදත් නිපදවනවා, එම නිසා ඒ අයට හැම අයුරින්ම උපකාර කරන්න ඕනෑ බවයි. මේක අමූලික බොරු කථාවක්.

ගරු කථානායකතුමනි, සභානායකවරයා කළ ඒ කථාවම තොන්ඩමන් මන්ත්‍රීවරයාත් කම්කරු නායකයකු වන අසීස් මහත්මයාත් සෑම තැනම කථා කරනවා. මේ රටේ සිටින ඉන්දියානුවන්ට, ප්‍රජා උරුමය දීම, ඡන්ද බලය ලබා දීම, එසේ නැතිනම් දේශපාලන අයිතිවාසිකම් ලබාදීම, පදනම් කරගෙන කියන කථාන්තරයක් ඒ. නමුත් ගරු කථානායකතුමනි, ඇත්ත එය නොවෙයි.

මේ රටේ වැවිලි කර්මාන්තය ආරම්භයේදීම එකවරටම මේ කැලෑ එළිවුණේ නැහැ. මේ වගාවන් එක වරටම ඇරඹුවේ නැහැ. වගාවක් ආරම්භ කරන්ට පෙර මේ කැලෑ එළි කරන්න ඕනෑ. ඉන් පසුව කාණු කපා පොළොව සකස් කරන්න ඕනෑ. ඉන් පසුවයි, පැළ සිටුවීම ආදී කටයුතු පටන් ගන්නෙ. එසේ ආරම්භ කළ වගාවන් සරුවට වැඩෙන්න තවත් අවුරුදු තුන හතරක් ගත වෙනවා. එම නිසා ඒ කාලය තුළ ඒ වගාවෙන් කිසිම ආදායමක් ලැබෙන්නෙ නැහැ. අන්න ඒ කාලය තුළදී, කැලෑ එළි කිරීම, කාණු කැපීම පොළොව සකස් කිරීම, පැළ සිටුවීම ආදී සියලුම කටයුතු කළේ ඉන්දියානු ජාතිකයන් නොවෙයි,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]
මේ රටේම උපන් මේ රටේම සිටි අපේ ගැමි සිංහල ජනතාවයි. ඔවුන්ට ලැබුණේ ඉතාමත්ම සුළු වේතනයක්. නමුත් මේ වගාවන් සරුවට වැඩී, තේ දළු එන විට එයින් ආදායම ලැබෙන විට, ඒ වාගේ එතෙක් වැඩ කළ සිංහල ගැමියන් ඉවත් කර ඒ වෙනුවට ඉන්දියානු ජාතිකයන් මෙරටට ගෙන්වා ස්ථිර කම්කරුවන වශයෙන් ඒ වාගේ සේවයට යොදවා ගත්තා. ඒ වගාවන් ආරම්භයේදී, ඒ ආරම්භක කටයුතුවල නිරතවුණු දැන් අවුරුදු 70, 80, 90 වයස ගත වූ ගැමියන් සිටිනවා. ඒ අය මේ වගාවන් ආරම්භ කළ හැටි, ඒ වාගේ වැඩ කළ හැටි අදත් කියනවා. එම නිසා, ඉන්දියානුවන් මේ රටට ඇවිත් වගා වන් කළ නිසා මේ රටේ ජාතික ආදායම වැඩි වුණාය කියන දුරමතය බිඳීමටත් මම මේ කාරණා ඉදිරිපත් කළේ. එදා සිටි සිංහල ගැමියන් මේ වතුවල මූලික වැඩ කටයුතු මහත් දුෂ්කරතාවන් මධ්‍යයේ කරගෙන ගිය බව අප අමතක කරන්න නරකය. දැන් තොලම ආදී පහසු කටයුතු සඳහා ඉන්දියානුවන් මෙරටට ගෙන්වා ගැනීමෙන් පසුව මේ රටේ රක්ෂා සියල්ලම වාගේ ඔවුන් අල්ලාගෙන සිටිනවා. මෙන්න මෙහෙමයි මේ ප්‍රශ්නය පැන නැගුණේ.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මේ පළබඳව තවත් කාරණයක් මතක් කර දෙන්න කැමතියි. 1933 අවුරුද්දේදී ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය මේ රටේ ඇති වුණා. ඉන් පසුව සුළු සුළු බලතල කිපයක් මේ රටේ ඇමතිවරුන් හත් දෙනකුට පැවරුණා. එදා තිබුණු මන්ත්‍රණ සභාවට සම්පූර්ණ බලතල පැවරුණේ නැති අතර සම්පූර්ණ නිදහස් පාලනයක් ලැබුණේ නැහැ. එදා එම මන්ත්‍රණ සභාවට පත් වූ උදවියගේ යුතුකමක් තිබුණා මෙම ඉන්දියානු ප්‍රශ්නය ගැන යම්කිසි වැඩ පිළිවෙළක් යොදන්න. 1933 සිට 1948 දක්වා පමණ කාලය තුළදී මේ ප්‍රශ්නය පිළිබඳව නිසි වැඩ පිළිවෙළක් අනුගමනය කළා නම් බොහෝ දුරට මෙය විසඳාගන්ට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. නමුත් ඒ වකවානුව තුළදී මේ ප්‍රශ්නය ලිහිල් කිරීම සඳහා වැඩ කටයුතු යොදනවා වෙනුවට මේ ප්‍රශ්නය තවත් උග්‍ර වීමට වැඩ කටයුතු යෙදුණා. අපේ අභාග්‍යයකට මෙන් ඉන්දියානුවන් වෙනුවෙන් පෙනී සිටි තැනැත්තකු, මගේ මතකයේ හැටියට 1933 සිට 1936 දක්වා කාලය තුළදී කම්කරු ඇමති ධුරයක් දැරුවා. ඒ කාලය තුළදී ඇති වූ සිද්ධිය කුමක්ද? නැසීගිය ගරු ඩී. එස්. සේනානායක මහතා ඇමතිවරයකු වශයෙන් එකල පත්වී සිටි නමුත් මේ කම්කරු ඇමතිවරයාගේ ක්‍රියා කලාපයට විරුද්ධව නැගී සිටින්න පුළුවන් කමක් තිබුණේ නැහැ. ඒ ඇමතිවරයා ගත්ත කුමන වැඩ කටයුත්තකට වුවත් විරුද්ධ මතයක් දක්වන්න පුළුවන් වුණේ නැහැ. වතුවල සේවයට, වතු නඩත්තුවට, වතුයාමය පෝෂණයට මේ පිරිස අවශ්‍යය. ඒ නිසා එක්තරා ක්‍රමයකින් වැසුණු වුවත් මේ පිරිස ගෙන්වා ගත යුතුය යන හැඟීමකින් වැඩ කටයුතු කළා මිස මේ පිරිස යැවිය යුතුය කියන හැඟීමකින් වැඩ කළේ නැහැ. 1948 න් පසු අද වනතුරු ඇති වූ තත්ත්වය මොකක්ද? 1948 න් පසු, ලංකාව ස්වාධීන රාජ්‍යයක් බවට පත් වූවාට පසු, ප්‍රශ්නයක් පැන නැගුණා. කවුද මේ රටේ පුරවැසියන්, කියන ප්‍රශ්නයට මුහුණ පාන්නට එදා තිබුණු ඩී. එස්. සේනානායක ආණ්ඩුවට සිදු වුණා. 1948 පුරවැසි නීතිය අනුව මේ ප්‍රශ්නයට මුහුණ පෑමට ඒ ආණ්ඩුවට සිදු වුණා. ඒ අනුව එක්තරා ක්‍රමයකින් කොන්දේසි කිපයක් අනුව ලියා පදිංචි කර පුරවැසිකම් ලබා ගැනීමට සිදු වුණා. අගමැතිනිය හෝ අගමැති හිතන විධියට අවුරුද්දකට සම්මාන පුරවැසිකම් 25 බැගින් දෙන්නට අයිතියක් ඇති වූ අතර, එක්තරා කාලයක් මේ රටේ නොකඩවාම ජීවත්වීමේ කොන්දේසි ක්‍රමයක් අනුව ලියාපදිංචි වීමට අවස්ථාවද ලබා දුන්නා. ඒ ලියාපදිංචි වීමේ නීතිය අනුව— දැන් ලියාපදිංචි වීමේ වැඩ කටයුතු අවසාන වී තිබෙනවා—1,33,000 ක පමණ පිරිසක් මේ රටේ පුරවැසියන් හැටියට සුදුසු අය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලංකාවේ සිටින ඉන්දියානුන් ආපසු ඉන්දියාවට යැවීම

වශයෙන් ලියාපදිංචි වී තිබෙනවා. සෙසු අය එක්කෙනකුවත් මේ රටේ පුරවැසියන් හැටියට සැලකීමට කිසිම ඉඩක් නැහැ.

ගරු කථානායකතුමනි, ඇත් මේ නීතියේ බරපතළ අඩුපාඩුකම් දෙකක් තිබෙනවා. මේ ප්‍රශ්නය විග්‍රහ කර එදා වැඩ කටයුතු කළ ආකාරය අනුව එක්තරා අවාසියක් ඇති වුණා. ඒ වගන්තියේ බරපතළ අඩුපාඩුකම් ඇති වුණා. මේ නීතිය අනුව යම්කිසි නපුරවැසියකු පුරවැසියකු සමග විවාහ වී අවුරුද්දක් ගත වූ පසු මේ රටේ පුරවැසිකම් ලැබීමට අයිතිවාසිකම් තිබෙනවා. ගත වන්නට ඕනෑ අවුරුද්දක් පමණයි. අද ඒ බරුල ලබා ගෙන ඉන්දියානුවන් දහස් ගණනක්—පුරවැසිකමට කිසිම අයිතියක් නැති අය—පුරවැසිකම් ලබා ගන්නවා. සල්ලි ටිකක් දීලා කොහේ හරි කාන්තාවක් සමග විවාහ ගිවිස ගත්තාය කියා පුරවැසිකම ගන්නවා. ඔවුන් අඹු සැමියන් වශයෙන් ජීවත් වෙනවා තබා හඳුනන්නේවත් නැති අය. එහෙම කර අවුරුද්දක් ගිය විට පුරවැසිකම් ලබා ගත් අය ඉන්නවා. ඒ කපොල්ලෙන් ඕනෑම කෙනකුට පුරවැසිකම් ලබා ගන්නට පුළුවනි.

ගරු කථානායකතුමනි, අනික් කපොල්ල මේකයි. ඊයේ මේ රටට ඉන්දියන්කාරයකු හොරෙන් පැමිණියොත්, ඔහු ඒ මොහොතේම අල්ලා ගන්නට බැරිවුණොත් ඔහු ලංකාවට පා තැබුවාට පසු අල්ලා ගත්තත්. 1948 පුරවැසි නීතිය අනුව ඔහුට නිදහසක් තිබෙනවා. ඊයේ නොවෙයි, අද පැමිණුණු කල්ලතෝනියකු වුවත් ලංකාවට අඩිය තැබූ මොහොතේම අල්ලා ගන්නට බැරි වුණොත් මම 1948ට කලින් ලංකාවේ හිටියාය කියන්නට ඔහුට පුළුවන්. ඒ සමගම ලංකාවේ සිටින තවත් කවරුන් හෝ වේවා එක්කෙනකු එය අනුමත කරන එක පමණයි තිබෙන්නේ. හොරෙන් ලංකාවට පැමිණියත් ඔහු හොර වැසියකු නොවන බව පිළිගැනීමට එපමණයි කරන්නට ඕනෑ. මොකක්ද මේකෙ තේරුම? 1948 නීතිවලින් අද ඇති වෙලා තියෙන විපාකය ඒකයි. මේ රටට හොරෙන් ආ උදවිය ලක්ෂ ගණනක් අද මේ රටේ ඉන්නව. තව තවත් උදවිය කිසිම බියක් නැතිව මේ රටට එනව. මේ රටට එවැන්නන් ගෙන්වා ගැනීමටත් ගෙන්වා ගත් උදවිය මේ රටේ නතර කර ගැනීමටත් ඇත් සංවිධාන ඇති කර තිබෙනවා. හොරෙන් ගෙන්වා ගන්නට සංවිධානයක් තොන්ඩමන් මන්ත්‍රීවරයා විසින් ඇතිකර තිබෙනව. හොරෙන් ඇවිත් අහවුණු හැටියෙ ඔවුන් කියන්නෙ 1948 දී ලංකාවෙ හිටියය කියන කතාවයි. 1948 දී මේ රටේ හිටපු බව කියා සිටින මේ පුද්ගලයින්ගෙන් ඇහුවොත් මේ අවුරුද්ද මොකක්ද කියල, මේ අවුරුද්ද 1963 බව කියන්න තරම්වත් දැනුමක් ඔවුන්ට නැහැ. ඒකවත් කියන්න ඔවුන් දන්නෙ නැහැ. ගිය අවුරුද්ද කීයද කියල ඇහුවොත් 1962 බව කියන්න දන්නෙත් නැහැ. මේ කපොල්ල තියෙන නිසයි ඔය විධියෙ තත්ත්වයක් ඇතිවෙලා තියෙන්නෙ. මේක බේරුමක් කර ගන්න මේ ආණ්ඩුවට තවමත් බැරි වුණා.

1948 නීතිවලින් විශේෂ වරප්‍රසාදයක්, වාසියක්, ඇති වෙලා තියෙනව. ඒකත් මතක් කරන්න ඕනෑ. මේ අවාසි දෙක අතර වාසියකුත් ඇති වෙලා තියෙන නිසා ඒකත් මතක් නොකර ඉන්න හොඳ නැහැ. මොකක්ද ඒ වාසිය? 1947 මහ මැතිවරණයේදී පාවිච්චියට ගත් ඡන්ද දායක ලැයිස්තුවල ඉන්දියානු ජාතිකයින් දෙලක්ෂ පණස් දාහක් පමණ හිටපු බව අපි දන්නව. පුරවැසි පනත ක්‍රියාත්මක කිරීම නිසා ඒ නම් 2.50 000 කෙළින්ම නැතිල ගියා. ඔවුන්ට ඡන්ද බලය අහිමි වුණා. ගරු මුදල් ඇමතිතුමා මේතන හිටිය නම් හොඳයි මේ ගැන කියන විට. මා කියන්න යන කාරණයෙ වැදගත්කම එතුමාට හොඳට තේරෙනවය කියල මම හිතනව. එතුමා හොඳාකාර දන්නව ඇති එදා ඔය ඉන්දියානු ජාතිකයින්ට ඡන්ද බලය තිබුණු කාලෙ මොකක්ද සිද්ධ වුණේ කියන එක. ඡන්දය ලබා ගැනීම සඳහා එදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

ඉන්දියානුවන්ගෙ නායකයන් පසුපස්සෙ බැගෑපත් ලීලාවෙන් ගමන් කරන්න සිදු වී තිබුණු බව එතුමාට මතක ඇති.

**එම්. ඒ. ජේ. විජේසිංහ මයා.** (වාරිය පොල)

*(திரு. எம். ஏ. ஜே. விஜேசிங்க—வாரியப் பொல)*

(Mr. M. A. J. Wijesinghe—Wariapola)

ගණපූරණයක් නැහැ, කථානායක තුමනි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

මොකක්ද මේකෙ තේරුම කථානායක තුමනි? ආණ්ඩු පක්ෂයෙන්ම ගණපූරණ යක් නැතෙයි කියන එක තමයි මෙතන ඉස්තරම්. වාරියපොළ ගරු මන්ත්‍රීතුමාව අල්ලගෙන ගරු සභානායකතුමා මෙතනට පණිවුඩයක් එවා රට පාවා දෙන්න හදන හැටි ඔබතුමාටත් පෙනී යනවා නේද?



**මන්ත්‍රී මණ්ඩලය ගණින් කොට, ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදි.**

## කල් තැබීම

## ஒத்திவைப்பு

## Adjournment

පසුව ගණපූරණයක් නොතුබූයෙන්, කථානායක තුමා විසින් 11 වන ස්ථාවර නියෝගය යටතේ ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 3.24ට, 1963 ඔක්තෝබර් 17 වන බ්‍රහස්පතින්දා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

*அதன் பிரகாரம், பி. ப. 3.24 க்கு, 1963 அக்டோபர் 17 ஆம் தேதி வியாழக்கிழமை பி. ப. 2 மணி வரை சபை ஒத்திவைக்கப் பெற்றது.*

Adjourned accordingly at 3.24 P.M. until 2 P.M. on Thursday, October 17, 1963.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

1964

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30. தபால்மூலம் 45 சதம். முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

1964

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

1964

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

இலங்கை, வாழைச்சேனை ஈஸ்ரேண் பேப்பர் மில்ஸ் கோப்பரேஷனால் உற்பத்தி செய்யப்பட்ட காகிதத்தில், இலங்கை அரசாங்க அச்சகத்திற் பதிப்பிக்கப்பெற்றது

Printed at the Government Press, Ceylon, on paper manufactured at the Eastern Paper Mills Corporation, Valaichchenai, Ceylon

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org